# 2024

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

# Annual Performance Report














සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

**Department of Animal Production and Health**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2024


සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

**Department of Animal Production and Health**

**Peradeniya**

**SriLanka**

**Tel: 94-081-2388337/2388462**

**Fax: 94-081-2388619**

**Web Site: www.daph.gov.lk**

## පටුන

පිටු අංකය


**1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1. හැඳින්වීම 01

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01

1.3. ප්‍රධාන කාර්යයන් 02

1.4. සංවිධාන සටහන 04

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 07

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 07

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2.1. 2024 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය 08

2.2. 2024 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය 09

2.3. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි විස්තරාත්මක ප්‍රගතිය 10

2.4. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 16

2.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති යෝජනා 18

**3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය**

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 19

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 20

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 21

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 22

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 23

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 24

3.7. විගණකාධිපතිවරයාගේ වාර්තාව 25

**4. කාර්යසාධන දර්ශක**

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 44

**5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 44

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 45

**6.** **මානව සම්පත් පැතිකඩ**
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 46
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති ආකාරය 46
6.3. මානව සම්පත් සංවර්ධනය 47

**7.** **අනුකූලතා වාර්තාව** 49

**<u>2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව</u>**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**<u>වැය ශීර්ෂ අංකය - 292</u>**

# 1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### 1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

### 1.2.2. මෙහෙවර

නිරෝගිමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

### 1.2.3. අරමුණු

- ❖ සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- ❖ සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ❖ ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රවලිත කිරීම.
- ❖ සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රවලිත කිරීම.
- ❖ තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- ❖ පශු එන්නත්සාර සහ අනෙකුත් පශු ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණාගාර සේවා සම්මත පරීක්ෂණාගාර තුලදී ඉටුකර දීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල පනත් සහ රෙගුලාසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීම, ඒ සඳහා උපදෙස් ලබාදීම හා නිරීක්ෂණය කිරීම.
- ❖ තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- ❖ කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ❖ ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- ❖ සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- ❖ පරිසර හිතකාමී, විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- ❖ සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ❖ ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘතීම සිංචන වැඩසටහන මෙහෙයවීම.
- ❖ අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය.
- ❖ සත්ත්ව ජාන සම්පත් ආරක්‍ෂණය
- ❖ එළුවන්ගේ ආරය නැංවීම.
- ❖ පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රවලිත කිරීම.
- ❖ රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රානිකට්, කුකුල් කොළරා බෲසෙල්ලා S19) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- ❖ බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය.
- ❖ සැල්මොනෙල්ලෝසිස් හා රානිකට් රෝග පාලනය.
- ❖ අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම.

- ❖ සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ශන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.
- ❖ කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම.
- ❖ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම.
- ❖ කිරි තාක්ෂණ පරික්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම.
- ❖ ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම.
- ❖ දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම.
- ❖ පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය.
- ❖ කුකුළු පාලනයට අදාළ නියාමන කටයුතු.
- ❖ සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු.
- ❖ අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය.
- ❖ නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරික්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම.
- ❖ පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/ සීප්පුකුලම) පවත්වාගෙන යාම.
- ❖ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ❖ ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම.
- ❖ ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන පැවැත්වීම.
- ❖ පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම.
- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම.
- ❖ පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම.
- ❖ පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාලවල පහසුකම් වැඩිදියුණු කිරීම.
- ❖ පරිසර හිතකාමී පශු සම්පත් ගොවිපළ පහසුකරණය.
- ❖ ව්‍යාප්ති සේවාවන් සැපයීම.

## 1.4. සංවිධාන සටහන


Organizational Structure
DG
ADG /Admin
ADG /Animal Health
ADG /Veterinary Research
ADG /Program Planning & International Affair
ADG /Livestock Development
D /AD
CA
CIA
D/AH
D/VR
D/VRA
D/LPE
D/AB
D/HRD
CE
VPH Sp.
P.Sc 6
DE. Sp
Vet. In. Sp.
C. Vac
VR. Sp
R/ AF
R/ VD
CA QO
CLE
AB. Sp
C. Agro
LE. Sp. 2
AD ad1
AD ad2
Acct
DD/ AH
DD/ VR
DD/ R
DD/ TS
DD/ LPE
LE
DD/ AB
DD/ DD
DD/ HR D
Tri
AO
LP O
RA/ S
I&C TO
SO
Eng.
Middle Level Staff and Primary Level Staff
Other Staff: DO, Le.Ass, TO, Drftm, RA, MSO, LIB, LDO
Dri, Tra.Ope., LA, Mech, BO, Car, Elec, Ban.Kee, Watc, BBC, MM, GtC, AG, LM, KKS, ACA, GL, SL, FA

| | |
|---|---|
| **DG** | -අධ්‍යක්ෂ ජනරාල් |
| **ADG** | -අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| **D/AD** | - අධ්‍යක්ෂ, පරිපාලන |
| **D/VRA** | - අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති |
| **D/LPE** | - අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික |
| **D/HRD** | - අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන |
| **D/AB** | - අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන |
| **D/VR** | - අධ්‍යක්ෂ, පශු පර්යේෂණ |
| **D/AH** | - අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය |
| **CA** | -ප්‍රධාන ගණකාධිකාරී |
| **CLE** | -ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ |
| **CE** | - ප්‍රධාන වසංගතවේදී |
| **VPH.Sp.** | -පශු මහජන සෞඛ්‍ය විශේෂඥ |
| **P.Sc** | -ප්‍රධාන විද්‍යාඥ |
| **DE.Sp.** | -කිරිගව ඉංජිනේරු විශේෂඥ |
| **Vet.In.Sp.** | -පශු විමර්ශන විශේෂඥ |
| **C.Vac** | -ප්‍රධාන එන්නත්වේදී |
| **R/AF** | -ලේඛකාධිකාරී (සත්ත්ව ආහාර) |
| **R/VD** | -ලේඛකාධිකාරී (පශු ඖෂධ) |
| **CAQO** | -ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී |
| **AB.Sp.** | -සත්ත්ව අභිජනන විශේෂඥ |
| **VR.Sp.** | -පශු ප්‍රජනන විශේෂඥ |
| **C.Agro.** | -ප්‍රධාන ශෂ්‍යවේදී |
| **LE.Sp.** | -පශු ව්‍යාප්තිසේවා විශේෂඥ |
| **CIA** | -ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **Acct.** | -ගණකාධිකාරී |

| | |
|---|---|
| **DD/AH** | -නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය |
| **DD/VR** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ |
| **DD/R** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ |
| **DD/TS** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය |
| **DD/LPE** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික |
| **DD/HRD** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන |
| **DD/AB** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන |
| **DD/DD** | - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කිරිගව සංවර්ධන |
| **LE** | -පශු ආර්ථික විශේෂඥ |
| **AD. Ad** | -සහකාර අධ්‍යක්ෂ, පරිපාලන |
| **SVP** | -එන්නත්සාර අධිකාරී |
| **AQO** | - සත්ත්ව නිරෝධායන නිලධාරී |
| **VRO** | - පශු පර්යේෂණ නිලධාරී |
| **VIO** | - පශු විමර්ශන නිලධාරී |
| **VS** | -පශු වෛද්‍ය නිලධාරී |
| **LO** | -සත්ත්ව පාලන නිලධාරී |
| **RO** | -පර්යේෂණ නිලධාරී |
| **Leo** | -නීති නිලධාරී |
| **Eng.** | -සිවිල් ඉංජිනේරු |
| **AO** | -පරිපාලන නිලධාරී |
| **RA/S** | -පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය) |
| **LPO** | -පශු සම්පත් ප්‍රවර්ධන නිලධාරී |
| **Trl** | -භාෂා පරිවර්තක |
| **I & CTO** | -තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී |
| **SO** | -සංඛ්‍යාලේඛනඥ |
| **LaS** | - රසායනාගාර විද්‍යාඥ |

අනෙකුත් කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| DO | -සංවර්ධන නිලධාරී |
| Le.Ass | -නීති සහකාර |
| RA | - පර්යේෂණ සහකාර |
| LDO | -පශු සම්පත් සංවර්ධන නිලධාරී |
| TO-Civil | -තාක්ෂණ නිලධාරී-සිවිල් |
| TO-Mechanical | - තාක්ෂණ නිලධාරී-කාර්මික |
| Drftm | -සැලසුම් ශිල්පී |
| MSO | -කළමණාකරන සේවා නිලධාරී |
| LIB | -පුස්තකාලාධිපති |
| WR | -නේවාසිකාගාර පාලක |
| Dri | -රියදුරු |
| Tra.Ope. | -ට්‍රැක්ටර් ක්‍රියාකරු |
| LA | -රසායනාගාර සහායක |
| Mech | -යාන්ත්‍රික ශිල්පී |
| BO | -බොයිලේරුකරු |
| Car | -වඩුකරු |
| Elec | -විදුලි ශිල්පී |
| Ban.Kee. | -බංගලා භාරකරු |
| Watc | -මුරකරු |
| BBC | -පට්ටි ගොනුන් රැකබලාගන්නා |
| MM | -කිරිකරු |

| | |
|---|---|
| GtC | -එළුවන් රැකබලාගන්නා |
| AnG | - සත්ත්ව රැකවල්කරු |
| LM | -තණකොළ කපන්නා |
| KKS | -කාර්යාල කාර්ය සහායක |
| ACA | -සත්ත්ව පාලන සහායක |
| GL | -උද්‍යාන කම්කරු |
| SL | -සනීපාරක්ෂක කම්කරු |
| FA | -ක්ෂේත්‍ර සහායක |

## 1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ❖ සත්ත්ව අභිජනන අංශය
- ❖ සත්ත්ව සෞඛ්‍ය අංශය
- ❖ පශු අණපනත් හා නීති අංශය
- ❖ පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- ❖ මානව සම්පත් සංවර්ධන අංශය
- ❖ පශු පර්යේෂණ ආයතනය
- ❖ මුදල් අංශය
- ❖ පරිපාලන අංශය

## 1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන

❖ සත්ත්ව අභිජනන අංශය
කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)

❖ සත්ත්ව සෞඛ්‍ය අංශය
පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)

❖ පශු අණපනත් හා නීති අංශය
සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ, කටුනායක, මත්තල, යාපනය)

❖ මානව සම්පත් සංවර්ධන අංශය
සත්ත්ව පාලන විද්‍යාල (කරදගොල්ල, සීප්පුකුලම)
අඛණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව
පශු ව්‍යාප්ති සේවා කවුළුව- ප්‍රධාන කාර්යාලය
ව්‍යවසායකත්ව හා ආයෝජන ප්‍රවර්ධන ඒකකය

❖ පශු පර්යේෂණ ආයතනය
මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය - කරදගොල්ල
සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

## 1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

FAO මූල්‍යාධාර සහිතව ක්‍රියාත්මක වන "ගුණාත්මක තෘණ හා රනිල ප්‍රභේද හඳුන්වාදීමෙන් හා ඒවායේ පෝෂණ තත්ත්වය කළමනාකරණය කිරීම තුළින් සුළු පරිමාණ කිරි ගොවීන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය" 2023 වර්ෂයේදී ආරම්භ විය. මේ සඳහා රු.මි. 16 ක විදේශාධාර ලැබුණු අතර 2024.12.31 දිනට රු.මි. 8.1 ක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබුණි.

මෙම ව්‍යාපෘතියට අදාලව වැඩිදියුණු කළ තෘණ හා රනිල ප්‍රභේද 02 ක් (Stylosanthus guanensis var. guanensis සහ Napier hybrid CO-6) හඳුන්වා දී ඇත.

එයට අදාළ මාතෘ තෘණ තවාන් 03 ක් ස්ථාපනය කර (පොලොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය /තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය/පශු පර්යේෂණ ආයතනයේ ගොවිපොළ) පවත්වා ගෙන යනු ලැබේ.

පළාත් මට්ටමින් ආදර්ශ තෘණ තවාන් 42 ක් උතුර, ඌව, දකුණ, මධ්‍යම, උතුරුමැද, වයඹ හා නැගෙනහිර යන පළාත් තුළ පිහිටුවා ඇති අතර, මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් 49 ක් හඳුන්වා දී ඇත. මෙම ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන්වලට අදාලව පළාත් 07 ක් තුළ නිලධාරීන්, ප්‍රතිලාභී ගොවි මහතුන් හා ව්‍යවසායකයින් 371 ක් පුහුණු කර ඇත.



Stylosanthus ප්‍රභේදය පෞද්ගලික අංශය සඳහා හඳුන්වාදීමේ ආදර්ශන වැඩසටහන - ගන්නෝරුව



පශු වෛද්‍ය නිලධාරීන් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන - වන්නිගම , වයඹ පළාත



Stylosanthus මාතෘ තෘණ තවාන - තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය වයඹ පළාත

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. 2024 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන්හි මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 73.00 | 36.29 | 49.71 |
| 2 | පුනරාවර්තන වියදම් | 870.43 | 824.76 | 94.75 |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | සත්ත්ව සෞඛ්‍ය හා පශු පර්යේෂණ | 233.20 | 196.80 | 84.39 |
| 2 | පශු සම්පත් සංවර්ධන සහ පුහුණු | 358.80 | 233.51 | 65.08 |
| | **කෘෂිකර්ම නවීකරණ වැඩසටහන-අමාත්‍යාංශ ප්‍රතිපාදන** | | | |
| 1 | දේශීය කිරි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාගේ ආදායම ඉහළ නැංවීමේ කිරි ගොවි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය | 35.00 | 26.32 | 75.21 |
| | **විදේශ ව්‍යාපෘති** | | | |
| 1 | FAO/TCP/SRI/3903 -ගුණාත්මක තෘණ හා රනිල ප්‍රභේද හඳුන්වාදීමෙන් හා ඒවායේ පෝෂණ තත්ත්වය කළමනාකරණය කිරීම තුළින් කුඩා පරිමාණ කිරි ගොවීන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 16.00 | 8.1 | 50.62 |
| 2 | රසායනාගාර ජාලය ශක්තිමත් කිරීම | 1.44 | 0.43 | 29.86 |

## 2.2. 2024 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1 | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 200.00 | 121.48 | 60.74 | 80 |
| 2 | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | 20.00 | 17.41 | 87.07 | 87 |
| 3 | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | 46.20 | 46.20 | 100 | 63 |
| 4 | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | 20.00 | 6.25 | 31.27 | 37 |
| 5 | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | 30.00 | 17.61 | 58.71 | 83 |
| 6 | පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 5.00 | 4.74 | 94.79 | 99 |
| 7 | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 80.00 | 72.62 | 90.77 | 94 |
| 8 | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 15.00 | 1.20 | 8.03 | 57 |
| 9 | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 27.70 | 27.65 | 99.83 | 92 |
| 10 | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 4.00 | 3.83 | 95.89 | 77 |
| 11 | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මගින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 10.00 | 5.78 | 57.70 | 74 |
| 12 | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 2.00 | 1.96 | 98.08 | 43 |
| 13 | සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම | 30.00 | 30.00 | 100 | 100 |
| 14 | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 16.00 | 13.39 | 83.70 | 66 |
| 15 | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන, සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන, පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන,පොත් හා ප්‍රකාශන වැඩසටහන | 20.00 | 5.84 | 29.22 | 59 |
| 16 | කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම තුළින් තත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 86.10 | 60.18 | 69.90 | 80 |
| 17 | පුහුණු ධාරිතාවය ඉහළ නැංවීම | 10.00 | 6.0 | 60.00 | 55 |

## 2.3. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### I. සත්ත්ව අභිජනන අංශය

#### අ. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය

**කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන**

කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන යටතේ 2024-12-31 වන විට කෘත්‍රිම සිංචන 202,082 ක්ද, ගැබ් පරීක්ෂා කිරීම් 67,111 ක්ද, පැටවු උපත් 61,189 ක්ද සිදුකර ඇත. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ නිපදවන ලද ගව ශුක්‍ර වඩි ගණන 216,292 කි. කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම යටතේ කෘත්‍රිම සිංචන ශිල්පීන් 180 ක් පුහුණු කර ඇත.

**සත්ත්ව ආහාර සම්පත් ප්‍රවර්ධනය**

මේ යටතේ තෘණ ව්‍යවසායකයින් 36 දෙනෙකු ලියාපදිංචි කර අදාළ සහතික නිකුත් කර ඇත. අභිජනන මධ්‍යස්ථානවල තෘණ සංවර්ධන වැඩසටහන යටතේ කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේ වැඩිදියුණු කළ තෘණ වගාව සඳහා අදාළ ජල සැපයුම් පද්ධතිය ස්ථාපනය කර ඇත. එම මධ්‍යස්ථානවල තෘණ සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය හේ බේලර් යන්ත්‍ර (Hay Bailer) 02 ක් මිලදී ගෙන එහි ආදර්ශන කටයුතු සම්පූර්ණ කර ඇත. තෘණ රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා මේ දක්වා ඉල්ලුම් කර ඇති සියළු අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත.

**එළුවන්ගේ ආරය උසස් කිරීම**

එළු ගහනය වර්ධනය කිරීම යටතේ අභිජනනයට සුදුසු එළුවන් නිකුත් කිරීමට අදාළව එළුවන් 35 ක් (පිරිමි-06, ගැහැණු-29) ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේ Caprine Arthritis Encephalitis (CAE) රෝගය පැතිරීම හේතුවෙන් සතුන් නිකුත් කිරීම 2024 අප්‍රේල් මස සිට තාවකාලිකව අත්හිටුවා ඇත.

#### ආ. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

| විස්තරය | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|
| පුං ගවයින් ආනයනය කිරීම<br>බ්‍රසීලියන් මිල්කින් ගීර්- 03<br>ජර්සි - 02<br>ෆ්‍රීෂියන් - 02<br>සහිවාල් - 05 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් පුං ගවයින් මිළදී ගැනීමට කටයුතු කළ අතර එය අසාර්ථක වීම හේතුවෙන් වර්තමානයේ Government to Government ක්‍රමවේදය යටතේ පුං ගවයින් මිලදී ගැනීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී. |
| ජෛව ආරක්ෂණ වැට ඉදිකිරීම | මේ වන විට ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. |
| උපකරණ ප්‍රසම්පාදනය | නව උපකරණ මිලදී ගෙන ඇති අතර, එමගින් කෘත්‍රිම සිංචනයට අවශ්‍ය ගව ශුක්‍ර නිෂ්පාදනය කාර්යක්ෂම කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. |

## II. පශු අණපනත් හා නීති අංශය

### අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 81,720 දෙනෙකුගේ කන් සලකුණු (ear tags) සවිකර ඇති අතර මුද්‍රණය කළ හා බෙදාහරින ලද කන් සලකුණු ප්‍රමාණය 93,012 කි. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායි නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

### ආ. සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 292-02-03-06-2507 වැය ශීර්ෂය යටතේ 2024 වර්ෂය සඳහා රු.මි. 4.00 ක ප්‍රතිපාදන වෙන්විය. 2023 වසරේ මෙම වැය ශීර්ෂය යටතේම සිදුකළ ප්‍රධාන ක්‍රියාකාරකම් 02 ක් වන කොළඹ සත්ත්ව නිරෝධායන කාර්යාලයේ වහල සහ ගේට්ටුව අළුත්වැඩියාව හා කටුනායක සත්ත්ව නිරෝධායන කාර්යාලය සඳහා ලැප්ටොප් පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා රු.මි. 3.03 ක මුදලක් ගෙවීම වෙනුවෙන් යෙදවීමට සිදුවිය.

එබැවින් 2024 වර්ෂයේ ඉතිරි රු. 962,000 ක මුදල 2024.10.29 දින සංශෝධනයට ලක් කරන ලද ප්‍රසම්පාදන සැලසුමට අනුව එහි ක්‍රියාකාරකම් සඳහා යොදවන ලදී. මෙම වසරේ සිව්වන කාර්තුවේදී මුද්‍රණ යන්ත්‍ර 04 ක් (රු.මි.0.3), ඡායා පිටපත් යන්ත්‍රයක් (රු.මි.0.36) සහ Micro Chip Readers 04 ක් (රු.මි.0.31) මිලදී ගැනීමට සැලසුම් කර තිබූ අතර එහිදී Micro Chip Readers 04 හැර අනෙකුත් යන්ත්‍ර මිලදී ගන්නා ලදී. අපේක්ෂිත මිල ගණන් වලට සාපේක්ෂව වෙළඳපොළ මිළ ගණන් ඉහළ යාම හේතුවෙන් Micro Chip Readers 04 මිලදී ගැනීමට නොහැකි විය.

### ඇ. තත්ත්ව ආරක්ෂණ වැඩසටහන

"තත්ත්ව ආරක්ෂණ හා නිරෝධායන කටයුතු" වැඩසටහන යටතේ සිදුකරනු ලබන කාර්යයන් අතරින් 2024 වර්ෂය සඳහා හඳුනාගත් ඉලක්කවන සත්ත්ව ආහාර සම්බන්ධ කටයුතු, පශු ඖෂධ අධිකාරියේ කටයුතු, සත්ත්ව හා සත්ත්ව නිෂ්පාදන ආනයන, අපනයන සඳහා පූර්ව නිෂ්කාශන නිකුත් කිරීම සහ නිරෝධායන කටයුතු ආවේක්ෂණය කිරීම යන කාර්යයන් සඳහා සමාලෝචිත කාල සීමාව තුළ සමස්ත වශයෙන් 76% ක පමණ ප්‍රගතියක් අත් කරගෙන ඇත.

## III. සත්ත්ව සෞඛ්‍ය අංශය

### අ. සතුන්ගේ බෝවන රෝග වැළැක්වීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ, දිවයින පුරා සත්ත්ව රෝග පාලනය කිරීම පිණිස සත්ත්ව රෝග ආවේක්ෂණ කටයුතු හා පශු විමර්ශන මධ්‍යස්ථානවල රෝග පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි. තවද වසංගත රෝග එන්නත්කරණය ඇතුළු සත්ත්ව රෝග පාලනයට අදාළ සියළු කාර්යයන් මෙමගින් සිදුකෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ කුර හා මුඛ රෝග එන්නත් වඩි 281,340 ක්, කාලගාත්‍ර එන්නත් වඩි 60,598 ක් හා රක්තාශ්‍රව එන්නත් වඩි 148,620 ක් ක්ෂේත්‍රයට බෙදා දී ඇති අතර කුර හා මුඛ රෝග එන්නත් කිරීම් 254,174 ක් කාලගාත්‍රා එන්නත් කිරීම් 72,324 ක් හා ගව රක්තාශ්‍රව එන්නත් කිරීම් 92,650 ක් මේ වන විට ක්ෂේත්‍රය තුළ සිදුකර ඇත.

**ආ. කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම**

කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් හා බිත්තර අපනයනය කිරීම ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඒ සඳහා ආර්ථික වශයෙන් වැදගත් වන සැල්මොනෙල්ලා, රනිකට් සහ කුරුළු උණ ආවේක්ෂණ වැඩසටහන් සිදුකරනු ලබයි.

සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන යටතේ කුකුළු අභිජනන ගොවිපොළ නිරීක්ෂණ 89 ක්ද බීජ රක්කවනාගාර නිරීක්ෂණ 104 ක්ද සිදුකර ඇත. රනිකට් රෝග පාලනය යටතේ එන්නත් 5,280,600 ක් බෙදා හැර ඇත. කුරුළු උණ ආවේක්ෂණ කටයුතු යටතේ රුධිර සාම්පල 3,207 ක් හා වසුරු සාම්පල සහ Cloacal swabs 19,146 ක් ද කුරුළු උණ රෝග පරීක්ෂාව සඳහා යොමුකර ඇත.

**ඇ. පශු විමර්ශන මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීම හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළ සඳහා ඉක්මන්, සාධාරණ හා වඩාත් ලාභදායී ක්‍රමයක් යටතේ අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ හරහා රෝග නිර්ණය කිරීමට අපේක්ෂිතය. එමඟින් එම රෝග පාලනය වෙනුවෙන් ක්ෂණික පියවර ගැනීමට අදාළ ගොවිපොළ හිමියනට අවස්ථාව ලැබේ. ඊට අමතරව 2023 වර්ෂයේ අවසන් කාර්තුව සිට මෙම ව්‍යාපෘතිය මගින් අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළවල ජෛව ආරක්ෂණ පරීක්ෂාව සිදුකිරීම ආරම්භ විය.

දෙපාර්තමේන්තුව විසින් පත්කළ තාක්ෂණික කණ්ඩායම් 02 න් කුමන හෝ කණ්ඩායමක් විසින් එම මත්ස්‍ය ගොවිපොළ වෙත ගොස් එහි ජෛව ආරක්ෂණය සඳහා අදාළ නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි. ඊට සමගාමීව පශු විමර්ශන නිලධාරීන් විසින් එම ගොවිපොළවලින් වසරකට දෙවතාවක් සාම්පල ලබාගැනීම සහ අවශ්‍ය පරීක්ෂාවන් සිදුකරනු ලබන අතර අවශ්‍යතාවය අනුව මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානය වෙත යොමුකිරීම සිදුකෙරේ. මෙම අණුක ජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය ඇතුළු පරීක්ෂණ කට්ටල මෙම ව්‍යාපෘතිය හරහා මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානය වෙත ලබා දී ඇත. මූලික වශයෙන් වැඩිම අපනයනය පාදක කරගත් විසිතුරු මත්ස්‍ය ගොවිපොළ ගහණයක් සහිත බස්නාහිර සහ වයඹ පළාත් පාදක කරගනිමින් දිවයින පුරා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

**ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන**

මෙම වැඩසටහන අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, නුවරඑළිය, කුණ්ඩසාලේ, දඹුල්ල, හෝමාගම, පොළොන්නරුව හා රත්නපුර පශු විමර්ශන මධ්‍යස්ථාන යටතේ ක්‍රියාත්මක වේ. එමගින් වන ජීවීන්ගේ පවතින සත්ත්ව රෝග ගෘහාශ්‍රිත හා කෘෂිකාර්මික සතුන් වෙත බෝවීමේ අවදානම අවම කිරීම සඳහා ආවේක්ෂණ කටයුතු සිදුකරනු ලබයි.

මේ වන විට වන ජීවී කලාප ආශ්‍රිත දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන මගින් වන ජීවී කලාප ආවරණය වන පරිදි, රෝග වලින් මිය ගිය සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර අදාළ සාම්පල රසායනාගාර වෙත යොමු කර පරීක්ෂා කරනු ලබයි. මීට අමතරව දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන හා වනජීවී නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වමින් දැනුවත් කිරීම් කටයුතු සිදුකරමින් පවතී. මෙම වැඩසටහනේ රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම් යටතේ ප්‍රගතිය 90% ක් පමණ වේ.

## IV. මානව සම්පත් සංවර්ධන අංශය

### අ. සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම

මේ වන විට කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ සිසුන් 50 දෙනෙකු NVQ 5/6 දෑ අවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමාව (2024/26 කණ්ඩායම) හදාරමින් සිටියි. 2024.10.15 දින සිට ආරම්භ කරන ලද සිසුන් 24 දෙනෙකුගෙන් සමන්විත සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ NVQ 4 සයමාසික සත්ත්ව පාලන ඩිප්ලෝමාව මසාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

### ආ. පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම හා තොරතුරු ලබාදීම සිදුකරන අතර 2024 .12.31 වන විට ප්‍රදර්ශන 03 ක් සඳහා දායකත්වය දැක්වීමට ද, රූපවාහිනී සහ වීඩියෝ වැඩසටහන් 18 ක් සහ ගුවන් විදුලි ප්‍රචාරක වැඩසටහන් 51 ක් ඉදිරිපත් කිරීමට ද හැකි වී ඇත.

### ඇ. පුහුණු ධාරිතාවය ඉහළ නැංවීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන පශු වෛද්‍ය උපාධිධාරීන් සඳහා සීමාවාසික පුහුණුව ලබාදීම යටතේ නවක පශු වෛද්‍ය උපාධිධාරීන් 78 දෙනෙකු සඳහා සීමාවාසික පුහුණුව ලබා දී ඇති අතර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා පුහුණු වැඩසටහන් 35 ක් සමාලෝචිත කාල සීමාව අවසන් වන විට පවත්වා ඇත. එමෙන්ම අවශ්‍යතාවය පරිදි ගොවීන් හා වෙනත් ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් 05 ක් සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය මගින් පවත්වා ඇත.

### ඈ. දේශීය කිරි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් කිරි ගොවියාගේ ආදායම ඉහළ නැංවීමේ කිරි ගොවි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පළාත් හයක් තුළ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක් ආවරණය කරමින් ක්‍රියාත්මක වන අතර, දැනට යැපුම් මට්ටමේ පවතින නමුත්, ඉහළ නිෂ්පාදන විභවයක් ඇති ගොවිපොළවලට තාක්ෂණය හඳුන්වා දීම තුළින් සුළු පරිමාණ කිරි නිෂ්පාදන ව්‍යවසායකයින් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් පළාත් මට්ටමින් කිරි ගොවින් 157 ක් (මධ්‍යම - 20, වයඹ - 63, ඌව - 27, උතුර -21, බස්නාහිර -12, දකුණ -14) තෝරාගෙන ඇත.

තෝරාගත් ගොවිපොළ සඳහා කිරි ගොවිපොළ ආර්ථික මොඩලයක් (Economic model) සහ යහපත් ගොවිපොළ පාලන ක්‍රම 12 ක් (Best Practices) ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පුහුණු වැඩසටහන් 18 ක් පවත්වා තෝරාගත් ගොවීන් සහ අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. මෙම ව්‍යවසායකයින් සඳහා කිරි ගොවි ව්‍යවසායක අත්පොත සහ සටහන් පොත් සකසා මුද්‍රණය කර ලබා දී ඇත. පුහුණු වැඩසටහන් අවසන් වූ පසු සියළුම ගොවිපල සඳහා වෙන වෙනම ගොවිපොළ ක්‍රියාකාරි සැලසුම් 157 ක් සාදා නිම කර ඇත.

තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ආවරණ කබා (overalls) (150) සහ Boot Pairs (150), කිරි වරන ලද එළදෙනුන් සඳහා බුරුළු ප්‍රදාහයට අදාළ නික්ෂේපණ (Mastitis dry cow infusions) (2,000), මුල් අදින ලද CO5 තෘණ දඬු කැබලි (Rooted CO5 cuttings) (10*300) ලබා දී ඇත.

ගොවිපොළ ක්‍රියාකාරි සැලසුම මගින් හඳුනාගන්නා ලද නිෂ්පාදන ඉලක්කය වෙත ළගාවීම වෙනුවෙන් යහපත් ගොවිපොළ පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ සඳහා සුදුසු තාක්ෂණය හඳුන්වා දීම යටතේ, අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය හඳුනාගත් අතර මූල්‍යමය දායකත්වය ඉල්ලුම් කළ

සියළුම පළාත් සඳහා ගෙවීම් කිරීම 2024.12.31 වන විට අවසන් කර ඇත. එම ප්‍රතිපාදන හරහා පළාත් මගින් ගොවීන් හට කිරි දොවන යන්ත්‍ර, තෘණ කැබලිකරන යන්ත්‍ර, සයිලේජ් බැරල්, කාපට්, තෘණ වගාව සඳහා අවශ්‍ය ජල සම්පාදන උපකරණ වැනි අත්‍යාවශ්‍ය උපකරණ ලබාදී ඇත. මීට අමතරව ගවගාල් නවීකරණය කර දී ඇත.




ව්‍යවසායක අත්පොත ලබා දීම



ගොවිපල ක්‍රියාකාරී සැලසුම් සැකසීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම



ව්‍යවසායකයින් සඳහා Boot සපත්තු සහ ආවරණ කබා (Overalls) ලබා දීම



ක්ෂේත්‍රයේ CO5 තෘණ වර්ගයේ අඳු සිටුවීම

තෝරාගත් පළාත් 06 සඳහා ජංගම සායන පවත්වනු ලැබූ අතර, ඊට සමගාමීව ගොවිපොළ සතුන් සඳහා අවශ්‍ය ඛණිජ මිශ්‍රණ පැකට්, bypass fat පැකට්, පණු බෙහෙත්, කිනිතුල්ලන් ඉවත් කිරීම සඳහා භාවිතා කරන බෙහෙත් බෝතල්, වසු පැටවුන් සඳහා කිරි බෝතල් (calf feeding bottle) ව්‍යවසායකයින් 150 දෙනා වෙත ලබා දෙන ලදී.

## V. පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය

### අ. සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

මේ යටතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන දත්ත, සත්ත්ව ගහණය, ගොවිපොළ සංඛ්‍යාව සහ පශු වෛද්‍ය කාර්යාලවල මානව හා භෞතික සම්පත්වල තොරතුරු එකතු කරනු ලැබේ. එම තොරතුරු ආශ්‍රිතව Livestock Statistical Bulletin, Livestock Outlook, වාර්ෂික වාර්තාව වැනි ප්‍රකාශන ප්‍රකාශයට පත්කරනු ලබයි. පශු සම්පත් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් සහ නිෂ්පාදකයින්ගෙන් ලබාගන්නා දත්ත පදනම් කරගෙන Poultry forecast, Poultry bulletin, Dairy bulletin ප්‍රකාශයට පත් කරයි.

මෙම වැඩසටහන තුළින් කිරිගව, කුකුළු හා එළු පාලන ක්ෂේත්‍ර යටතේ සමාජ ආර්ථික අධ්‍යයනයන් 04 ක් 2024 වසර තුළ ක්‍රියාත්මක විය. තවද ගොවිපොළ ලියාපදිංචි කිරීම යථාවත් කිරීමේ දත්ත පද්ධතිය ස්ථාපිත කර ඇති අතර එය කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් සියළු පළාත්වල පශු වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්යමණ්ඩල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ලියාපදිංචි වී ඇති මුළු ගොවිපොළ සංඛ්‍යාව 83,262 කි.

### ආ. පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වසර සඳහා පශු අණපනත් හා නීති අංශය හා සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් ඩිජිටල් ජාලකරණ පද්ධතිය සකස් කිරීම සඳහා කටයුතු යොදා ඇත. මේ වන විට එහි මෘදුකාංග කටයුතුවලට අදාල ප්‍රසම්පාදන කටයුතු අවසන්ව ඇති අතර, තෝරාගත් ආයතනය විසින් එහි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වාර්තාව ලබා දී ඇත.

පශු පර්යේෂණ ආයතනය, පශු ඖෂධ පනත් හා නීති අංශය සහ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන වෙනුවෙන් පරිගණක මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන වාර්තාව සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාදවීම හේතුවෙන්, එය 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද දෙපාර්තමේන්තු නව වෙබ් පිටුව 2024 වසරේ අප්‍රේල් මස වන විට සම්පූර්ණ කර එළිදක්වන ලදී.

## VI. පශු පර්යේෂණ ආයතනය

### අ. උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය තවදුරටත් පුළුල් කිරීම සිදුකෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත්වල තත්ත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනය කිරීමත් අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වසරේදී ගව රක්තාශ්‍රව, කාලගාත්‍රා, සහ රැනිකට් එන්නත් දේශීයව නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | 2024.12.31 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| කුර හා මුඛ | 266,640 | 295,020 |
| ගව රක්තාශ්‍රව (Alum) | 40,000 | 40,000 |
| ගව රක්තාශ්‍රව (Oil adjuent) | 150,000 | 150,000 |
| කාලගාත්‍රා | 65,868 | 130,000 |
| රැනිකට්-I | 4,569,200 | 8,696,500 |
| රැනිකට්-II | 2,223,200 | 2,223,200 |
| කුකුල් කොළරා | 294,660 | 354,060 |
| සූකර රක්තාශ්‍රව | 3,060 | 3,060 |
| බෲසෙල්ලා S19 | 10,000 | 10,000 |

### ආ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ මෙම වසර සඳහා තුන්වන කාර්තුව අවසන් වන විට සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 6,654 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

### ඇ. පශු සම්පත් පර්යේෂණ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ව්‍යාපෘති 27 ක් දැනට ක්‍රියාත්මක වේ. ඉල්ලුම පරිදි සාම්පල පරීක්ෂාව සහ ජෛවීය නිෂ්පාදනයන් සිදුකිරීම මේ මගින් ඉටුකරනු ලබයි.

| ක්‍රියාකාරකම | 2024.12.31 වන විට නිපදවූ ප්‍රමාණය |
|---|---|
| *ජෛවීය නිෂ්පාදන* | |
| බුරුළු ප්‍රදාහය හඳුනා ගැනීම සඳහා CMT ප්‍රතික්‍රියාකාරකය | ලීටර් 164 |
| Pullorum ප්‍රතිදේහජනක මාත්‍රා | මාත්‍රා 69,500 |
| MRT ප්‍රතිදේහජනක | මාත්‍රා 10,000 |
| බුරුළු ගිල්වනු ලබන ද්‍රාවනය (Teat dip solution) | ලීටර් 188 |

**ඈ. කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය**
මෙම ව්‍යාපෘතිය යටතේ දේශීයව කුර හා මුඛ රෝග එන්නත් සකස් කිරීම සිදුකරනු ලැබේ. 2025 වසර සඳහා එන්නත් වඩි 300,000 ක් නිෂ්පාදනයට සැලසුම් කර ඇත. 2024.12.31 වන විට එන්නත් වඩි 295,380 ක් නිෂ්පාදනය කර ඇත.

**ඉ. බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන**
මෙම ව්‍යාපෘතිය යටතේ බුරුළු ප්‍රදාහ ප්‍රතිකාරක 30,000 ක් සෑදීමට ඉලක්ක කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ බුරුළු ප්‍රදාහ නික්ෂේපන 21,588 ක් නිෂ්පාදනය කර ඇත.

## 2.4. පශු සම්පත් සංවර්ධනය උදෙසා 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

2024 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2025 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**කිරි ගව ක්ෂේත්‍රය**

**අ. සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය**
කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන යටතේ 2025 වර්ෂය තුලදී කෘත්‍රිම සිංචන 259,554 ක් ද ගැබ් පරීක්ෂා කිරීම් 115,549 ක් සහ පැටවු උපත් 81,736 ක්ද සිදු කිරීමට බලාපොරොත්තු වේ. කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මගින් ගව ශුක්‍ර වඩි ගණන 220,000 ක් නිපදවීමට බලාපොරොත්තු වේ. තටද මෙම ව්‍යාපෘතිය යටතේ කෘත්‍රිම සිංචන ශිල්පීන් 200 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට ද නියමිතය.
**සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම**

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෲසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2025 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණ කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

| *එන්නත් වර්ගය* | *ප්‍රතිශක්තිකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය* |
|---|---|
| *කුර සහ මුඛ රෝග* | *360,000* |
| *කාලගාත්‍රා* | *81,000* |
| *රක්තාශ්‍රව රෝග* | *112,500* |
| *බෲසෙල්ලා* | *7,500* |
| *රනිකට්* | *4,000,000* |

**ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

පශු පර්යේෂණ ආයතනය මගින් 2025 වසර සඳහා සතුන්ගේ බෝවන රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පහත අයුරින් එන්නත් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

| එන්නත් වර්ගය | ප්‍රමාණය |
|---|---|
| *කුර හා මුඛ* | *450,000* |
| *ගව රක්තාශ්‍රව (Alum)* | *20,000* |
| *ගව රක්තාශ්‍රව (Oil adjuent)* | *125,000* |
| *කාලගාත්‍රා* | *90,000* |
| *බෲසෙල්ලා* | *10,000* |
| *රනිකට්-I* | *5,8740,00* |
| *රනිකට්-II* | *2,521,000* |

**ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන**

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා පිහිට වූ සම්බන්ධීකරණ ඒකකය වැඩිදියුණු කිරීම, වනජීවී රෝග හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ රසායනාගාර ශක්තිමත් කිරීම සහ වනජීවී රෝග ආවේක්ෂණයට අදාල පරීක්ෂණ කටයුතු සිදු කිරීම හා නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය සිදු කිරීමට මෙමගින් බලාපොරොත්තු වේ.

**නීතිමය කටයුතු සහ සේවාවන්**

**අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන**

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2025 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන් 80,000 ක් සඳහා 2025 වසරේදී කන් සලකුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

**ආ. සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි කිරීම**

සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2025 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය මට්ටමේ අන්තර්ජාල පාදක දත්ත සමුදායක් නිර්මාණය කෙරේ. 2025 වර්ෂය සඳහා ගොවිපළ 100,000 ක් ලියාපදිංචි කිරීමට ඉලක්ක කර ඇත.

**පශු මහජන සෞඛ්‍ය සේවාවන්**

**අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම**

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන අතර දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිතයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමට අදාල පර්යේෂණ කටයුතු සිදු කරයි. 2025 වර්ෂයේදී සත්ත්ව ආහාර සාම්පල 2500 ක ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති යෝජනා

2024 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අමතරව පහත සඳහන් නව ව්‍යාපෘති යෝජනා 06 පසුගිය වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. නමුත්, එම ව්‍යාපෘති කිසිවක් සඳහා 2025 අයවැය මගින් ප්‍රතිපාදන අනුමත නොවිණි.

1. ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශවල දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම සඳහා පරිසර හිතකාමී පශු සම්පත් ගොවිතැන් පද්ධති වැඩිදියුණු කිරීම.
2. NVQ මට්ටම් 3, 4 සහ 5, 6 සහිත පශු සම්පත් නිෂ්පාදනයේ දක්ෂ තරුණයින් බිහි කිරීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා සීප්පුකුලම සත්ව පාලන විද්‍යාලය වැඩිදියුණු කිරීම.
3. පශු සම්පත් අංශයේ සැලසුම්කරණය සහ අධීක්ෂණය සඳහා සහාය වීම සඳහා තොරතුරු කළමනාකරණ ඒකකයක් (IMU) පිහිටුවීම.
4. කුණ්ඩසාලේ ශ්‍රී ලංකා සත්ව පාලන විදුහලේ (SLSAH) පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම.
5. ශ්‍රී ලංකාවේ වැඩිදියුණු කළ ඵලදායිතාව සහ සාරවත් බව සඳහා සංක්‍රාන්ති කිරි ගවයින්ගේ පරිවෘත්තීය රෝග අවම කිරීම.
6. ශ්‍රී ලංකාවේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සඳහා කිරි නිෂ්පාදන පෝෂණය ප්‍රශස්ත කිරීම.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

Dr. (Mrs.) K.A.C.H.A. Kothalawala
Director General
Dept. of Animal Production & Health
P. O. Box 13, Gatambe
Peradeniya

# 3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | තත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,143,279,000 | 1,109,849,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 59,250,354 | 32,001,642 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 33,154,677 | 31,221,729 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,235,684,031** | 1,173,072,371 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,235,684,031** | 1,173,072,371 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 40,000,000 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 1,195,684,031 | 1,173,072,371 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 642,520,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 612,111,458 | 525,093,369 | |
| 200,050,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 186,093,616 | 170,142,771 | ඒසීඒ-2(ii) |
| 27,860,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 26,562,542 | 24,506,745 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 870,430,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **824,767,615** | 719,742,885 | |
| | **මූලධන වියදම්** | | | | |
| 34,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 17,174,215 | 12,006,145 | |
| 9,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 7,274,914 | 2,233,627 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 10,000,000 | හැකියා වර්ධනය | 14 | 6,006,893 | 27,026,834 | |
| 613,440,000 | වෙනත් මූලධන වියදම් | 15 | 439,038,642 | 468,557,128 | |
| 666,440,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **469,494,664** | 509,823,734 | |
| | තැන්පතු ගෙවීම් | | 25,376,623 | 30,248,956 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 32,130,378 | 26,450,580 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 57,507,001 | 56,699,536 | |
| 1,536,870,000 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 1,351,769,280 | 1,286,266,154 | |
| (1,536,870,000) | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (156,085,248) | (113,193,784) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (161,329,807) | (113,193,784) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 5,244,559 | - | ඒසීඒ-3 |
| | | | (156,085,248) | (113,193,784) | |

ඩබ්.එච්.එම්.එම්.පී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ - පේරාදෙණිය

01

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 3,259,946,017 | 3,192,200,479 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 79,605,044 | 80,629,343 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම** | | **3,339,551,061** | **3,272,829,822** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 22,160,103 | 62,302,692 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 3,259,946,017 | 3,192,200,479 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 52,200,382 | 18,326,651 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 5,244,559 | - |
| **මුළු වගකීම** | | **3,339,551,061** | **3,272,829,822** |

පිටු අංක...07...සිට ...36... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...37.... සිට ...64... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ........................ | Hemal Athu... ........................ | ........................................ |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය :2025.02. 24 | දිනය :2025.02. 21 | දිනය :2025.02. 21 |
| ඩී.පී. වික්‍රමසිංහ<br>ලේකම්<br>කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය<br>80/5, "ගොවිජන මන්දිරය"<br>රජමල්වත්ත පාර, බත්තරමුල්ල. | ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල<br>අධ්‍යක්ෂ ජනරාල්<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>තැ.පෙ. 13, ගැටඹේ<br>පේරාදෙණිය<br>02 | ඩබ්.එච්.එම්.එම්.පී. හේරත්<br>ප්‍රධාන ගණකාධිකාරී<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>ගැටඹේ - පේරාදෙණිය |

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 192,320,817 | 127,671,642 |
| අග්‍රිම ලැබීම | | 1,143,279,000 | 1,109,849,000 |
| අත්තිකාරම් අයකර ගැනීම | | 31,815,580 | 29,857,040 |
| තැන්පතු ලැබීම | | 59,250,354 | 32,001,642 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **1,426,665,752** | **1,299,379,325** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 798,205,073 | 695,236,140 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 26,562,542 | 24,506,745 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 32,206,921 | 17,685,358 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 40,000,000 | - |
| අත්තිකාරම් ගෙවීම් | | 32,022,178 | 26,450,580 |
| තැන්පතු ගෙවීම් | | 25,376,623 | 30,248,956 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **954,373,337** | **794,127,778** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **472,292,415** | **505,251,547** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපකරණ අයකර ගැනීම | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 467,047,856 | 505,251,547 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **467,047,856** | **505,251,547** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(467,047,856)** | **(505,251,547)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **5,244,559** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම | | - | - |
| විදේශීය ණය ගැනීම | | - | - |
| ප්‍රදානයන් ලැබීම | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | | 5,244,559 | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | 5,244,559 | - |

2025.02.21
ඩබ්.එච්.එම්.එම්.පී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ - පේරාදෙණිය

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම “වාර්තාකරණ පදනම” යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

2025.02.01

6

## 3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ඒසීඒ -2

### 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය :292

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/පළාත් සභාවේ නම :
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 841,150,000 | 36,720,000 | (7,440,000) | 870,430,000 | 824,767,615 | 45,662,385 |
| | (2) ප්‍රාග්ධන | 73,000,000 | - | - | 73,000,000 | 36,501,996 | 36,498,004 |
| | උප එකතුව | 914,150,000 | 36,720,000 | (7,440,000) | 943,430,000 | 861,269,611 | 82,160,389 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | - | - | - | - | - | - |
| | (2) ප්‍රාග්ධන | 586,000,000 | | 7,440,000 | 593,440,000 | 432,992,667 | 160,447,334 |
| | උප එකතුව | 586,000,000 | | 7,440,000 | 593,440,000 | 432,992,667 | 160,447,334 |
| | මුළු එකතුව | 1,500,150,000 | 36,720,000 | - | 1,536,870,000 | 1,294,262,278 | 242,607,722 |

.....................................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2025.02. 21

07

**3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | **2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ව්‍යූහයන් | - | 1,124,379,275.54 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 691,595,635.81 | - | - |
| 9153 | ඉඩම් | - | 1,443,971,105.88 | - | - |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීපීසීජී/කේඩී/එෆ්/ඩීඑපීඑච්/ඒසී/2024/59 | ඔබේ අංකය / உமது இல. / Your No. |
| දිනය / திகதி / Date | 2025 මැයි 20 දින | |

ගණන්දීමේ නිලධාරී,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව.**

---

ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධනිත ස්වරූපී මූලධන වියදම රු.463,487,771 කින් වර්ෂයේ ප්‍රාග්ධනිත කිරීම | ප්‍රාග්ධනිත කළ හැකි සියළුම වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. | මෙම කාර්යන් උදෙසා අවශ්‍ය වන පශු පර්යේෂණ හා පශු සංවර්ධන කාර්යන් සඳහා අයවැය දෙපාර්තමේන්තුව මඟින් මූලධන වියදම් ලෙස 2507 වැය විෂය |

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

| | |
|---|---|
| රු.68,010,162 ක් එනම් මුළු මූලධන වියදමින් සියයට 15 ක් විය. ඒ අනුව දරන ලද මූලධන වියදමින් රු.395,477,609 ක් එනම්, සියයට 85 ක් ප්‍රාග්ධනික ස්වරූපී නොවන වියදම් වෙනුවෙන් දරා තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒසී/2024/59 | යටතේ ප්‍රතිපාදන වෙන් කර දෙනු ලැබේ. එම වැය විෂය යටතේ දෙපාර්තමේන්තුවෙන් සිදුකරනු ලබන නියාමන කාර්යයන් සහ අනෙකුත් තාක්ෂණික සේවාවන් සඳහා මිලදීගැනීම් වැඩි ප්‍රමාණයක් ප්‍රාග්ධනික ස්වරූපයේ නොවන වියදම් බව |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පැවති සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතු අගය වටිනාකම රු.7,007,580 ක් වූ සතුන් 295 ක් හා වටිනාකම ඉදිරිපත් නොවූ සතුන් 1,416 ක් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ පශු සම්පත් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒසී/2024/59 | පශු සම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ගිණුම්ගත කළ යුතුය. | සතුන් පිළිබඳ තොරතුරු සත්ත්ව ලේඛණයක සටහන් කර ඇති අතර එහි ඇති මව් සතුන්ට අදාල වන වටිනාකම වත්කමක් ලෙස ගිණුම්ගත කර ඉදිරියේ දී මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ හෙළිදරව් කිරීමට කටයුතු කරන බව |
| ii. ආයතනය සතු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් සියලුම වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) විධිමත් තක්සේරු අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු ඉඩම් 12 ක් නිලධාරී නිවාස 126 ක් තක්සේරු කර ගිණුම් ගත කිරීම අත්හැරී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒසී/2024/59 | දෙපාර්මේන්තුව සතු මූල්‍ය නොවන වත්කම් සියල්ල ගිණුම්ගත කළ යුතුය. | දෙපාර්තමේන්තුවට අදාල සියළුම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර දෙන ලෙස 2025 මාර්තු 26 දින තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. විමසුමේ සඳහන් ගිණුම්ගත කර නොමැති නිල නිවාස 126 හා ඉඩම් 12 ගිණුම්ගත කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව |

2

| | | |
|---|---|---|
| iii. වැය ශීර්ෂ යටතේ ගණුදෙනු වාර්තා කිරීමේදී සිදුවන වැරදි එම වැය ශීර්ෂය තුළින්ම ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වුවත් වැය ශීර්ෂයන්ගේ වැරදි නිවැරදි කිරීමට අදාළ ගැලපීම රු.264,635 ක් මූලධන නොවන වත්කම් ප්‍රකාශය තුළ වත්කම් අපහරණය යටතේ ගලපා තිබුණි. මේ අනුව වාර්ෂික අපහරණයක් සිදු නොවී පැවතියදී අපහරණ සිදු කර ඇති බවට වූ සාවද්‍ය හෙළි කිරීම් මූල්‍ය ප්‍රකාශයේ අනාවරණය කර තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩ්/එෆ්/බීඑපීඑච්/එසී/2024/59 | වැය ශීර්ෂයන්ගේ වැරදි එම වැය ශීර්ෂය මඟින් නිවැරදි කරගත යුතුය. | ඉදිරියේ දී එවැනි විශේෂිත කරුණු සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව |

(ඇ) විගණනයට සාක්ෂි නොමැති වීම

පහත සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.1.1, 2.3 ප්‍රකාර වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු මඟින් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ගිණුම් ගත කළ යුතුවේ. නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට කේත අංක 9151, 9152, 9153 යටතේ ගිණුම්ගත කර තිබූ එකතුව රු.3,259,946,017 ක් වූ මූල්‍ය නොවන වත්කම් වල එසේ | අදාළ මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව විධිමත් තක්සේරු සිදු කර මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත යුතුය. | පරිපාලන අංශය විසින් ඉඩම්, ගොඩනැගිලි, වාහන, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ වලට අදාල කොරතුරු සෑම අංශයකින්ම අදාල ආකෘති මඟින් ලබාගෙන ස්ථාවර වත්කම් ලේඛන සැකසූ පසු මුදල් අංශය විසින් CIGAS පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව |

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| | තක්සේරු කරන ලද අගය සනාථ කිරීමට අදාළ වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.<br>යොමුව - සිපිසිජී/කෝඩී/එෆ්/ඩීඑම්එච්/ඒඕ/2024/59 | | |
| ii. | එමෙන්ම යථෝක්ත මාර්ගෝපදේශයේ 1.3.1, 2.3, 4.3 වගන්ති ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සෑම වර්ෂ 05 කට වරක්ම තක්සේරු කළ යුතු වුවත් එම නියමයෙන් බැහැරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඊට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.<br>යොමුව - සිපිසිජී/කෝඩී/එෆ්/ඩීඑම්එච්/ඒඕ/2024/59 | මාර්ගෝපදේශ විධිවිධානයන්ට අනුව කටයුතු කල යුතුය. | දෙපාර්තමේන්තුවට අදාළ සියළුම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර දෙන ලෙස 2025 මාර්තු 06 දින තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව. |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| i | පනත්<br>1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ 6(ආ) 10(ii) වගන්ති | - | අහඹු ලෙස රට තුළ පවතින සත්ත්ව ආහාර සාම්පල වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට අදාළ නිසි සහයෝගය ලබා නොදීම නිසාවෙන් පනතේ විධිවිධාන අනුව රෙජිස්ටාර්වරයාගේ නිසි වගකීම ඉටුකළේ ද යන්න විගණනයට සනාථ කරගත නොහැකි විය. | විගණන විෂයය පථය සීමාවන පරිදි කටයුතු නොකළ යුතුය. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව |

| | | | | |
|---|---|---|---|---|
| | | කවද, රටතුල පවතින බිත්තර, මස්, කිරි නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය පිරිහීමට සත්ත්ව ආහාර වල බලපෑමක් පැවතීම නිසාවෙන් දෙපාර්තමේන්තුව සත්ත්ව ආහාර සම්බන්ධයෙන් තම හිසි වගකීමෙන් බැහැර වී ඇති බවද එය පරීක්ෂා කිරීමට අදාල ව විගණන විෂය පථය ද සීමා කර තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒයි/2024/59 | | |

ii කාර්ය පටිපාටික රීති

| | | | | |
|---|---|---|---|---|
| 2009 පෙබරවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1589/30 දරන කාර්යය පටිපාටික රීති මාලාවේ xviii වැනි පරිච්ඡේදයේ 193 වන ඡේදය | - | සෑම රාජ්‍ය නිලධාරියෙකුම සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ වූ විට ස්ථාන මාරු වීම් වලට යටත් විය යුතු වුවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 79 දෙනෙකු හට වසර 06 සිට වසර 21 දක්වා සේවා කාලයක් ස්ථාන මාරු වීම් ලබා දී නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/බී/2024/04 | වර්ෂ 5ක සේවා කාලයක් ගතවීමෙන් පසු නිලධාරීන් ස්ථානමාරු වීම් වලට යටත් විය යුතුය. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කර බව. |

iii චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2,405,450 | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවස්ථා 10 කදී නිලධාරීන් 03 කු හට රු.109,775 සිට රු.412,500 ක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/බී/2024/31 | නෛතික සීමාවන් ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබා නොදිය යුතුය. | මේ වන විට රු.100,000 වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබන බව |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,536,870,000 කින් දරන ලද මුළු වියදම රු.1,294,262,278 ක් වූ අතර ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.242,607,722 ක් හෙවත් සියයට 15 ක් ඌණ උපයෝජිතව පැවතුණි.<br>(යොමුව - සිපිසිජී/කේඩී/එල්/ඩීජීපීඑච්/ජීසී/2024/59-ii) | ප්‍රතිපාදන ඌණ උපයෝජනය නොවිය යුතුය. | තනතුරු පුරප්පාඩුව පැවතීම මත ඉන්ධන දීමනාව සඳහා වෙන් කල මුදල් ඉතිරිවීම, මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීම ආදිය මඟින් වියදම් අවම කර ගැනීමට කටයුතු කිරීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මනා ලෙස නඩත්තු කිරීම මඟින් අලුත්වැඩියා අවශ්‍යතා අවම වීම, තනතුරු පුරප්පාඩුව පැවතීම මත ප්‍රවාහන දීමනාව සඳහා වෙන් කළ මුදල් ඉතිරිවීම යනාදී හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි වූ බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එම ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට විශේෂයෙන් වගබලා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වැය විෂයයන් 12 ක් සඳහා රු.60,181,000 ක් අධි ඇස්තමේන්තුගත කර තිබූ අතර වැය විෂයයන් 08ක් සඳහා රු.24,388,000ක් ඌණ ඇස්තමේන්තුගතකර පැවතුණි.<br>(යොමුව - සිපිසිජී/කේඩී/එල්/ඩීජීපීඑච්/ජීසී/2024/59-ii) | හැකිතාක් දුරට සම්පූර්ණ හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් ආසන්න අගයකට සකස් කිරීමට වගබලා ගැනීමට කටයුතු කළ ඇතැම් සුවිශේෂී වූ හේතූන් මත යම් වෙනස්කම් සිදුවන බව |
| (ඇ) | වැය විෂයය අංක 2-2-21-2507 සඳහා මුදල් රෙගුලාසි 66 අනුව ප්‍රතිපාදන රු.1,440,000 ක් මාරු කර තිබුණු අතර ඉන් රු.1,004,720 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.<br>(යොමුව - සිපිසිජී/කේඩී/එල්/ඩීජීපීඑච්/ජීසී/2024/59-ii) | මු.රෙ.66 යටතේ මාරු කිරීම් අත්‍යාවශ්‍යතාවය මත පමණක් සිදු කළ යුතුය. | මෙම 292-2-2-21-2507 වැය විෂය WHO ව්‍යාපෘතිය යටතේ ලැබුණු මුදල් වෙනුවෙන් භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් වැය විෂයක් වන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙනත් වැය විෂයකින් මාරු කිරීමක් ලෙස ලබාගන්නා ලද බව |

2.2 බැරකම් හා බැඳීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන තුළ සටහන iii බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් ශේෂය රු.1,482,432 ක් දෙවතාවක් ගිණුම් ගත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති බැරකම් ශේෂය එම අගයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණු අතර ගිණුම් ගත කළ යුතු වටිනාකම රු.2,590,827 ක් වූ බැරකමක් ගිණුම් ගත කිරීම අත්හැරී තිබූ බැවින් එම අගයෙන් බැරකම් ශේෂය අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි.<br>(යොමුව - සිපිසිජි/හේඩි/එෆ්/ඩීඒපීඑච්/ඒසී/2024/59-ii) | වර්ෂය තුළ සාධිත සියලුම බැඳීම් හා බැරකම් වාර්තා කළ යුතුය. | බැරකම් ප්‍රකාශය තුල ඉදිකිරීම් දෙකක් වෙනුවෙන් බැරකම් සටහන් කළ යුතු වුවත් එම බැරකම් දෙකෙහිම වැරදීමකින් එකම අගය සටහන් කර ඇත. එබැවින් රු.1,108,395 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත වී ඇති බව |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.මි.112.68 ක් වූ ඉදිකිරීම් 68 කින් එකතු වටිනාකම රු.මි.74.22 ක් හෙවත් සියයට 72 ක ඉදිකිරීම් 49 ක් වර්ෂය තුළ ඉටු නොවී පැවතුණි.<br>(යොමුව - සිපිසිජි/හේඩි/එෆ්/ඩීඒපීඑච්/ඒසී/2024/59) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. | සතියකට එක් දිනක් පමණක් වැඩ බැලීමේ පදනම මත ඉංජිනේරුවරයෙක් 2024 අගෝස්තු 28 දින සිට සේවය කළ අතර තාක්ෂණික කාර්යය මණ්ඩල ධාරිතාවයේ විශාල අඩුපාඩු පැවති බැවින් 2024 වර්ෂයේ සැලසුම් කර තිබූ ඉදිකිරීම් හා අලුත්වැඩියාවලින් කොටසක් පමණක් සිදු කිරීමට සිදු වූ බව |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුණ්ඩසාලේ මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය | | |
| i. | 1980 වර්ෂයේ පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් ආරම්භ කර එමගින් දේශීය කුකුලන් වැඩිදියුණු කර ප්‍රවර්ධනය, පර්යේෂණ කටයුතු සිදු කිරීම යන අරමුණින් මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වූ නමුත් මෙහි කුකුල් පර්යේෂණ කටයුතු සිදු කිරීම 2018 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. එමෙන්ම උපරිම ධාරිතාවය 5,420 ක් වූ කුකුල් කූඩුවල කුකුලන් ඇති කිරීම 1976 ක් ලෙස සියයට 36 කින් අඩු වී පැවතුණි. (යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජීපීඑච්/ජීබීසී/2024/56) | ව්‍යාපෘතිය අරමුණින් බැහැරව ක්‍රියාත්මක නොවිය යුතු අතර රජයේ මුදල් නිශ්කාර්ය නොවීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය. | මෙම මධ්‍යස්ථානයේ අරමුණ ක්ෂේත්‍රයේ පවතින දේශීය ජාන සංරක්ෂණය බවත් කුකුළු පැටවුන්ගේ ඉල්ලුම (ඇණවුම් ප්‍රමාණය) අනුව බිත්තර රක්කවීම සඳහා කුකුලන් ගොවිපලෙහි ඇති කරනු ලබන බව |
| ii. | කුකුල් නිවාසවල සම්මත ප්‍රමාණයට වැඩියෙන් කුකුලන් 130 ක් රඳවාගෙන තිබීම හේතුවෙන් වර්ෂය තුළ රු.1,350,364 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි. (යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජීපීඑච්/ජීබීසී/2024/56) | -එම- | ගැහැණු කිකිළි පැටවුන් සඳහා යොමු කළ යුතු කුකුලන් ප්‍රමාණය ඊට අදාලව තාක්ෂණිකව අවශ්‍ය වන ගණන පමණක් ගොවිපල තුල තබාගෙන ගොවිපළක් පවත්වා ගෙන යා නොහැකි ඒ සඳහා ලිංග නිර්ණ නිරවද්‍ය ප්‍රතිශතය, මරණ අනුපාතය, අභිජනන කාර්යක්ෂමව හා වෙනත් තාක්ෂණික කරුණු සලකා බලනු ලබන බව |
| iii. | ආර්ථික වටිනාකම් කාලය අවසන් වී ඇති සතුන් 753 ක් අපහරණය අදාළව කළමනාකරණ තීරණ ගැනීමේ දුර්වලතාවය නිසාවෙන් සතුන් අපහරණය නොකිරීම තුළ 2025 මාර්තු 07 දින වන විට කුකුල් කෑම සඳහා පමණක් රු.1,334,814 ක අනවශ්‍ය පිරිවැයක් දරා තිබුණි. (යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජීපීඑච්/ජීබීසී/2024/56) | -එම- | සතුන් 484 ඉවත් කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත්කර එහි නිර්දේශ අනුව මේ වන විට මිල ගණන් කැඳවා ඇති බවත් එම සතුන් ද කඩිනමින් ඉවත් කරන බව |

(ආ) ඉඹුලන්දණ්ඩ පශු පර්යේෂණ ආයතනය

| | | |
|---|---|---|
| i. ඉදිරි වර්ෂ 05 ක් තුළ එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීම, වාණිජ ගොවිපලවල් ඇති කිරීම, බෝයර් වර්ගයේ එළු ශුක්‍රාණු නිපදවීම යන අරමුණු වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.37,341,430 ක් වැය දරා බෝයර් වර්ගයේ එළුවන් 100 ක් ආනයනය කර තිබුණද එය සෞඛ්‍ය නිර්ණායක හා ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව සිදු වී තිබුණි. (යොමුව - සිපිසිජ්/කේඩී/එෆ්/ඩීඑම්එච්/ඒ/2024/53) | ව්‍යාපෘතිය අරමුණින් බැහැරව ක්‍රියාත්මක නොවිය යුතු අතර රජයේ මුදල් නිශ්කාර්ය නොවීමට අදාළ බලධාරීන් වගබලා ගත යුතුය | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව |
| ii. 2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ රෝගී තක්ත්වයේ එළුවන් 141 ක් පමණක් ශේෂ වී පැවතුණු අතර ව්‍යාපෘතියේ අරමුණු මුළුමනින්ම ඉටු නොවී පැවතුණි. (යොමුව - සිපිසිජ්/කේඩී/එෆ්/ඩීඑම්එච්/ඒ/2024/52) | -එම- | පිළිතුරු ලබා දී නැත |
| iii. රෝගී එළුවන් (CEA රෝගී) අපහරණය සඳහා 2024 ජනවාරි 10 දින පත් කළ විශේෂ කමිටුව මගින් තීරණය ගෙන තිබු නමුත් එම තීරණ වර්ෂයක අධික කාලයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානයට එම රෝගී එළුවන් නඩත්තුව සඳහා රු.75,336,944 ක් ද ඔවුන්ගේ ආනයනික වැය ද ඇතුළුව එකතුව රු.112,678,374 ක් වූ වියදම් රජයට නිෂ්කාර්යය වියදම් වී තිබුණි. (යොමුව - සිපිසිජ්/කේඩී/එෆ්/ඩීඑම්එච්/ඒ/2024/53) | -එම- | මෙම එළුවන් නිරෝධායන කාල සීමාවේ සිටම CAE රෝගයට ගොදුරුවීම හේතුවෙන් සිදු වීම නිසා අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බව. |

9

| | | | |
|---|---|---|---|
| (ඈ) | තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය | | |
| i. | 2000 වර්ෂයේදී ජමුනාපාරි එළුවන් ව්‍යාප්ත කිරීම වෙනුවෙන් තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණු නමුත් ඉකුත් වර්ෂ 05 තුළ අදාළ ව්‍යාපෘතියේ අරමුණ වූ එළුවන් ප්‍රජාව වෙත ලබා දීම එළුවන් 213 සිට 31 ක් ලෙස ශීඝ්‍රයෙන් පහත වැටී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒ/2024/54) | ව්‍යාපෘතිය අරමුණින් බැහැරව ක්‍රියාත්මක නොවිය යුතු අතර රජයේ මුදල් නිශ්කාර්ය නොවිය යුතුය. | 2020-2022 කාලයේදී පැවති කොවිඩ් වසංගත තත්ත්වය, ඉන්ධන අර්බුධය සහ ආර්ථික අර්බුධය මේ සඳහා හේතු වූ බව |
| ii. | මධ්‍යස්ථානයේ සතුන් 13 ක් Blue Tounge රෝගයෙන් පෙළෙන අතර අනෙක් සතුන්ද රෝග වාහකයින් විය හැකි වුවත් එම. තත්ත්වය සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් හඳුනාගැනීමට කටයුතු නොකර එම රෝග වාහක එළුවන් නඩත්තු කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.34,331,552 ක් රජයට අවාසිදායක අයුරින් නිශ්කාර්යව වැය කර තිබුණි.<br>(යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒ/2024/54 | -එම- | BT ප්‍රතිදේහ සහිත සතෙකුට එම රෝගය තවත් සතෙකුට බෝකිරීමට හැකියාවක් නොපවතින බවත් එබැවින් මෙම සතුන් නඩත්තුව සඳහා දරණ ලද පිරිවැය නිෂ්කාර්ය පිරිවැයක් ලෙස අර්ථ දැක්විය නොහැකි බව |
| (ඇ) | පොළොන්නරුව කෘතිම සිංචන මධ්‍යස්ථානය | | |
| i. | වියළි කාලයට අදාළව දෙමුහුන් ගව වර්ග වල ශුක්‍ර නිෂ්පාදනය හා දෛනික කෘතිම සිංචන පුහුණු කිරීමේ අරමුණින් අක්කර 100 ක වපසරියක ගවයින් 48 ක් ඇති දැඩි කරමින් ගොවිපලෙහි කෘතිම සිංචන මධ්‍යස්ථානය ක්‍රියාත්මකව පැවතුණි. නමුත් මධ්‍යස්ථානයේ සිටින ගවයින් 48 අතරින් සතුන් 39 ක් රෝගී වීම හේතුවෙන් 2023 මැයි 23 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් අක්‍රිය වී පැවතුණි.<br>(යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒ/2024/36) | -එම- | ව්‍යාප්ත වූ රෝග තත්ත්වය පාලනය කිරීමට අපහසු වීමත් වියදම් පාලනය කිරීමත් අරමුණු කොට පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය තුළින් ගව ශුක්‍ර එකතු කිරීම, නිපදවීම හා බෙදා හැරීම යන කාර්යයන් තුනම නවතා ඇති අතර එම කාර්යය සම්පූර්ණයෙන්ම කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වෙතින් පමණක් සිදු කරන බව |

10

| | | | |
|---|---|---|---|
| ii. | රෝගී සතුන් අපහරණය සඳහා කඩිනම් මැදිහත් වීමක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සිදු නොකිරීම නිසාවෙන් වර්ෂ 01 මාස 08 ක කාලයක් වටිනාකම රු.3,067,797 ක් වූ ගව ශුක්‍ර වඩි 55,270 ක් නිෂ්පාදනය නතර වී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජීපීඑච්/2024/36 | ව්‍යාපෘතිය අරමුණින් බැහැරව ක්‍රියාත්මක නොවිය යුතු අතර රජයේ මුදල් නිශ්කාර්ය නොවිය යුතුය. | ව්‍යාප්ත වූ රෝග තත්ත්වය පාලනය කිරීමට අපහසු වීමත් වියදම් පාලනය කිරීමත් අරමුණු කොට පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය තුළින් ගව ශුක්‍ර එකතු කිරීම, නිපදවීම හා බෙදා හැරීම යන කාර්යයන් තුනම නවතා ඇති අතර එම කාර්යය සම්පූර්ණයෙන්ම කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වෙතින් පමණක් සිදු කරන බව |
| iii. | පූර්ණ වශයෙන් අකර්මණ්‍යය වී තිබූ මධ්‍යස්ථානය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.9,449,053 ක වියදමක් දරා තිබූ අතර එය රජයට නිශ්කාර්යය වැය බරක් වී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජීපීඑච්/2024/36 | -එම- | ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා රජයේ කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කරන එකම ආයතනය පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වන බව |

3.3 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සත්ත්ව අභිජනන අංශයට අදාළව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදන හා බෙදා හැරීම ඉහළ නැංවීම වන ව්‍යපෘතිය - 2023 මඟින් රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා වැය විෂයය අංක 292-2-3-20-2507 යටතේ රු.24,000,000ක් වූ වියදම් ඇස්තමේන්තු කර තිබුණි. තවද එම ව්‍යාපෘතිය මඟින් පුං ගවයින් ආනයනය කිරීම සඳහා රු.59,000,000 ක් ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණ නමුත් මෙම වර්ෂයේදී පුං ගවයින් ආනයනය | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ක්‍රියා කළ යුතුය. | සතුන් ආනයනය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා කටයුතු කළ ද ලංසුකරුවෙකු ඉදිරිපත් නොවූ බවත්. 2023 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම හරහා මිලියන 100 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබූ බව |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද රු.83,000,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයෙන්ම රු.72,346,750 ක් වැය කර රසායනාගාර උපකරණ මිලදී ගැනීමට කටයුතුකර තිබූ බැවින් ඇස්තමේන්තුගත රු.24,000,000 ක් වූ උපකරණ වෙනුවට රු.72,346,750 ක උපකරණ මිලදී ගැනීම තුළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව කටයුතු කර ඇති බවත් අවශ්‍යතාවය හඳුනාගෙන නිවැරදිව සැලසුම් පිළියෙල කර නොමැති බවත් දක්නට ලැබුණි. තවද රසායනාගාර උපකරණ මිලදී ගැනීමේ ඇස්තමේන්තුව සියයට 201 කින් විචලනය වීමට හේතු ප්‍රසම්පාදන කමිටු තීරණය තුළ ඉදිරිපත් වී නොතිබුණි.<br><br>යොමුව - සිපිසිජ්/කේඩී/එෆ්/ඩීජ්පීඑච්/බී/2024/33 | | |
| (ආ) | දියර නයිට්‍රජන් ලීටර් 350,000 ක් මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් මඟින් මිල ගණන් කැඳවා තිබුණු අතර ඉදිරිපත් වූ ආයතන 02 හි මිල ගණන් පත් පරීක්ෂා කිරීමේදී ටෙන්ඩරය ප්‍රදානය කර ඇති ආයතනය ඉදිරිපත් කළ ලංසු ලේඛනයේ සඳහන් මිල මකන දියර යොදා සංශෝධනය කර තිබුණු නමුත් ඒ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලැබී නොමැත |

12

පිළිබඳව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ප්‍රසම්පාදන ලිපිගොනුවේ සඳහන් කළ යුතු වුවද කිසිදු සටහනක් යොදා නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ වත්කම් නිෂ්කාර්ය නොකිරීමට කටයුතු කළ යුතු වුවත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන 04 ක රජය සතු වත්කම් 06 ක අයිතම් 28 ක් වර්ෂයට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යය කර තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජ්පීඑච්/ජීසී/2024/56<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජ්පීඑච්/ජීසී/2024/54<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජ්පීඑච්/ජීසී/2024/36<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීජ්පීඑච්/ජීසී/2024/34 | වත්කම් නිෂ්කාර්ය නොවන පරිදි උපයෝජනය කළ යුතුය. | කරදගොල්ල මධ්‍යම කුකුල් පර්යේෂණ ආයතනයේ 2025 වර්ෂය තුලදී ඉහත ගාල් දෙකෙන් එකක් හෝ සකස්කර ගැනීමේ අදහස ඇතිව මෙහි අංක 02 ගාල සඳහා මුදල් ප්‍රතිපාදන මේ වනවිට ඉල්ලුම්කර ඇති බව.<br><br>කෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට ගොවිපල භූමිය එලදායීව පවත්වාගෙන යාමට කටයුතු කරන ලද බව<br><br>ගොවිපල අවට පදිංචිකරුවන් බැවින් මෙම නිල නිවාස වල පදිංචිය සඳහා අවශයතාවයක් ඇති වී නොමැති බව<br><br>අපේක්ෂිත මට්ටමේ සතුන් ප්‍රමාණයක් ගොවිපල සතු නොවීම හේතුවෙන් හා 2024 වසරේ අභිජනන කටයුතු නැවැත්වීම තුළ මෙම එළු කොටුවල අවකාශය මුළුමනින්ම භාවිත කිරීමට නොහැකිව ඇති බව.<br><br>පොළොන්නරුව කෘෂිකර්ම සිංචන මධ්‍යස්ථානයේ යතුරුපැදිය දැනට |

| වත්කම | පැවති ආයතනය | ප්‍රමාණය |
|---|---|---|
| කුල් නිවාස | කරදගොල්ල මධ්‍යම කුකුල් පර්යේෂණ ආයතනය | 05 |
| නිලනිවාස | කෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය | 02 |
| | පොළොන්නරුව කෘෂිම සිංචන මධ්‍යස්ථානය | 06 |
| ගොඩනැගිලි | පොළොන්නරුව කෘෂිම සිංචන මධ්‍යස්ථානය | 03 |
| | ගන්නෝරුව අඛණ්ඩ අධ්‍යාපන ආයතනය | 01 |
| ඉඩම | කෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය | 01 (අක්කර 37) |
| එළු කොටු | කෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය නව එළු කොටු | 04 |
| | පැරණි එළු කොටු | 05 |
| යතුරු පැදි | පොළොන්නරුව කෘෂිම සිංචන මධ්‍යස්ථානය | 01 |

13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| | | | භාවිතා කිරීමට නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ඌණ උපයෝජිත බව<br><br>සයිලේජ් නිෂ්පාදන ගොඩනැඟිල්ල සයිලේජ් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය නොවන බව,<br><br>Semen Collection Yard කොටස කෘත්‍රිම සිංචන පුහුණු කටයුතු වල දී භාවිතයට ගන්නා බව.<br><br>ගන්නෝරුව අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආපනශාලාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පූර්ණ කාලීනව දේශන ශාලාවක් වශයෙන් භාවිතා කිරීමට අපේක්ෂිත බව |
| (ආ) i. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන 132 ක් පවතින අතර එම වාහන වලට අදාළව වාහන 16 ක් සඳහා පිරිවැය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ වාහන ඵලදායීව හා ආර්ථිකමයභාවයෙන් යුතුව විධිමත් කළමනාකරණයක් කළ යුතුය. | පිළිතුරු ලැබී නොමැත |
| ii. | රථ වාහන වලින් සියයට 51 කට රියදුරන් නොමැති වීමෙන් වාහන උපයෝජනය ප්‍රශස්ථ මට්ටමකට හෝ ඵලදායී මට්ටමකට ගෙන ඒමේ හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| iii. | මෙම ආයතනයේ පවතින වාහන අතරින් ධාවනයෙන් ඉවත් කරන ලද වාහන 12 ක් පැවතියද එම වාහන පිරිවැය වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

14

3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

| | | | |
|---|---|---|---|
| i. | ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් නිලධාරිනිය (සරජ්) විසින් සිදු කර තිබූ රු.14,749,160 ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිකුත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | පිළිතුරු ලැබී නොමැත |
| ii. | මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව සෘජුව වගකීමට බැඳෙන මුදල් නිලධාරිනියට (සරජ්) එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද මෙම අක්‍රමිකතාවයට වගකීමට බැඳෙන අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඑපීඑච්/බී/2024/15 | -එම- | -එම- |

3.6 ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 880 සිට 893 නියමයන් ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 38 දෙනෙකු රු.377,500 ක් වූ ඇප තැබීමට කටයුතු කර නොතිබුණි | ඇප තැබිය යුතු නිලධාරින් ඇප තැබීමට කටයුතු කළ යුතුය. | පිළිතුර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව |

යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඑපීඑච්/ඒඕ/2024/59

15

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**3.7** පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) i. මු.රෙ. 104 ප්‍රකාරව රජයට සිදු වූ හානි/පාඩුව නිශ්චිතව හඳුනාගෙන අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වුවත් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබූ අවස්ථා 392 කට අදාළ හානි හා පාඩු එකතු වටිනාකම රු.32,033,833 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/එසී/2024/59 | හානි පාඩු සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ පවත්වා වගකිවයුතු පාර්ශයවන්ගෙන් එම හානි අයකළ යුතුය. | (අ), (ආ), (ඇ) ඒ අනුව හානි පාඩු සම්බන්ධයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. |
| ii. මු.රෙ.104(4) ප්‍රකාරව හානි පාඩු සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තා සකස් කළ යුතු වුවත් වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබූ අවස්ථා 289 කට අදාළ හානි පාඩු එකතු වටිනාකම රු.6,711,879ක් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා නොලැබීම, මු.රෙ.104(4) වාර්තා නොලැබීම ආදී පාලනය කළ හැකි විවිධ හේතු මත පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/එසී/2024/59 | -එම- | -එම- |
| iii. හානි පාඩු සම්බන්ධයෙන් පරීක්ෂාවේදී එකතු වටිනාකම රු.255,534 ක් වූ සතුන් 30 ක් මියගොස් වර්ෂ 1 ත් 2 ත් අතර කාලයක් ගත වී තිබූ නමුත් අදාළ මරණ පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඒපීඑච්/එසී/2024/59 | -එම- | -එම- |

**3.8** අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව 2020 අගෝස්තු 01 දින කුර හා මුඛ රෝග එන්නත් 100,000 ක් ඒකක මිල රු.82 බැගින් මිලදී ගැනීම නිසාවෙන් රජයට සිදු වූ පාඩුව රු.මි.3.9 ක් වූ විය. 2024 ජනවාරි මස 11 වන දින පවත්වන ලද ගිණුම් කාරක සභා නියෝග අංක 19 මගින් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර | ගිණුම් කාරක සභාව නියෝග අනුව කටයුතු කළ යුතුය. | මෙම පරීක්ෂණ මණ්ඩලයේ බාහිර සාමාජිකයෙකු ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශයේ පරිපාලන නිලධාරී පත් කර ඇති අතර පරීක්ෂණ |

16

| | | |
|---|---|---|
| රජයට සිදු වූ අලාභයට වගකිවයුත්තන් හඳුනාගෙන අලාභය අය කර ගන්නා ලෙස නියෝග කර තිබුණි. ඒ සඳහා ආයතනයෙන් බැහැර කිසිදු රාජ්‍ය නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් තොරව, ගණන්දීමේ නිලධාරී යටතේ නිලධාරීන් 03 කුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් යොදවා පරීක්ෂණයක් සිදු කර තිබුණි. එහිදී කිසිදු අලාභයක් සිදු වී නොමැති බවට විමර්ෂණ වාර්තාව මඟින් තීරණය කර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සුදුසු මැදිහත් වීමක් සිදු කර නොතිබුණි.<br>යොමුව - සිපිසිපී/කේඩී/එෆ්/ඩීඑම්එච්/ඒ/2024/39 | | වාර්තාවේ පිටපතක් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව. |

3.9 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය සඳහා Automatic 20 L & 200 L Bioreactor යන්ත්‍රයක් 2022 ජූලි 29 දින මිලදී ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.96,548,000 ක් වැය දරා තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i. | වඩාත් ඵලදායී සහ අන්තර්ජාතිකව පිළිගත් අවධානම් පාදක කරගත් රෝග මර්ධන උපායමාර්ගික ක්‍රමවේදය හඳුනාගැනීමට පෙර රටේ කුර හා මුඛ රෝග එන්නත් වඩි අවශ්‍යතාවය 900,000 ක් බවත් එය පූරණය කිරීම වෙනුවෙන් දරන ලද ආනයනික වියදම රු.89,346,250 ක් (2018 සිට 2020 දක්වා) වුවද 2021 වර්ෂයේදී ඉහත රෝග මර්ධන ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් පසුව වාර්ෂික කුර හා මුඛ රෝග එන්නත් වඩි අවශ්‍යතාවය 300,000 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2021 වර්ෂයට පෙර ඉහත රෝග මර්ධන උපායමාර්ග අනුගමනය නොකිරීම නිසාවෙන් රු.89,346,250 ක අතිරේක ආනයන වියදමක් දැරීමට සිදුවීම තුල රජයට මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | රජයේ මුදල් වැය කිරීමේදී එම දරන ලද මුදල් වලින් උපරිම ඵලදායීතාවය ලබා ගත යුතුය. | (අ. 2018 පාදක කරගත් රෝග මර්ධන උපාය මාර්ග ක්‍රමවේදය අනුව 2021 වර්ෂයේ එන්නත් වඩි අවශ්‍යතාවය 300,000 ක් බව හඳුනා ගෙන ඒ අනුව නිසි තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් රෝග මර්ධන කටයුතු මේ වන විට දියත් කරමින් පවතින බව. |

| | | | |
|---|---|---|---|
| ii. | රටේ පවතින සාමාන්‍ය එන්නත් අවශ්‍යතාවය වූ 300,000 ක එන්නත් වඩි ප්‍රමාණය සපුරා ගැනීම වෙනුවෙන් රු.මි.96 ක් වැයකර වාර්ෂික එන්නත් වඩි 1,200,000 ක උපරිම ධාරිතාවයක් සහිත නව යන්ත්‍රයක් මිලදීගෙන තිබූ අතර එමගින් සාමාන්‍ය එන්නත් වඩි අවශ්‍යතාවය වූ 300,000 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම තුල රජයට ඉතා අධික මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණු අතර අදාළ යන්ත්‍රය උපරිම උපයෝජනය සීමා වී තිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඑපීඑච්/බී/2024/15 | රජයේ මුදල් වැය කිරීමේද එම දරන ලද මුදල් වලින් උපරිම ඵලදායීතාවය ලබා ගත යුතුය. | නව උපකරණය මගින් වාර්ෂිකව එන්නත් වඩි ලක්ෂ 12 ක් නිපදවිය නොහැකි අතර එහි උපරිම ධාරිතාවය වඩි ලක්ෂ 5 ක උපරිමයකි. එන්නත් වඩි ලක්ෂ 12 ක ප්‍රමාණය නිපදවීම වසර 5 කට සැලසුම් කර ඇති බව. |
| (ආ) i. | 2024 ජනවාරි 08 දිනැති සහකාර අධ්‍යක්ෂ 2024 බිම ඔප දැමීමේ සැලැස්ම යටතේ මාස 03 කට වරක් සිකුරාදා දිනයන්හි දී බිම ඔප දැමීමේ කටයුතු සිදු කරවා ගත යුතු වුවත් එම කටයුත්ත නියමිත පරිදි සිදු කර නොතිබුණි. | රාජකාරී පැවරීම අනුව අදාළ සේවය උපරිම අයුරින් සිදු කළ යුතුය. | පිළිතුරු ලැබී නොමැත |
| ii. | 2024 පෙබරවාරි 29 දිනැති අංක ඩීඑපීඑච්/ඒඩී/05/04/03 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජකාරී පැවරීම අනුව පරිශ්‍රයන්හි ඇති වැසිකිලි හා සනීපාරක්ෂක උපාංග හා බිම අවම වශයෙන් දිනකට තෙවරක් අනුමත විශබීජ නාශක යොදා පිරිමැද සේදීම කළ යුතු වුවත් මෙම කාර්යය නිසි පරිදි ඉටු වී නොතිබුණි.<br>යොමුව - සිපිසිජී/කේඩී/එෆ්/ඩීඑපීඑච්/ඒ/2024/24 ( iii) | -එම- | පිළිතුරු ලැබී නොමැත |

**4** යහපාලනය

**4.1** මහජනයා වෙත සේවය ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගන්නෝරුව මධ්‍යම පශු විමර්ශන මධ්‍යස්ථානයේ රසායනාගාර පරීක්ෂණ කටයුතු වලදී මත්ස්‍ය විෂයයට අදාළව මත්ස්‍ය රෝග පරීක්ෂා කර වාර්තා ලබා දෙනු ලබන අතර මත්ස්‍ය වගාකරුවන් හා මත්ස්‍ය ආනයන, අපනයන කටයුතු වෙනුවෙන් ලියාපදිංචි කිරීම් සිදු කරනු ලබයි. මේ අනුව මත්ස්‍ය අපනයන කිරීම සඳහා ගොවිපල ලියාපදිංචිය හා | මෙහෙයුම් කටයුතු වල කාර්ය සාධන ඵලදායී විය යුතුය. | ඉදිරියේ දී ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය සහ රසායනාගාර පහසුකම් ලද හොත් මෙම ආකාරයට එක් එක් අපනයනට අදාළ මත්ස්‍ය රොග පරීක්ෂා කිරීම සඳහා යොමු විය හැකි බව |

18

සහතික කිරීම මාස 06 කට වතාවක් ගොවිපල පරීක්ෂා කර බලා අදාළ ගොවිපල හා සතුන් අපනයනය වෙනුවෙන් අනුමැතිය ලබාදීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් සිදු වේ. මෙහිදී මෙම සතුන් අපනයනට අදාළ මත්ස්‍ය තොග පරීක්ෂා කර බලා අනුමැතිය ලබාදීම සිදු නොවීම තුළ මෙම ආයතනය නිකුත් කරනු ලබන සහතිකය හා ඊට අදාළ මත්ස්‍ය තොගය අතර ගුණාත්මකභාවයේ විෂමතාවයක් පැවතිය හැකි අතර පවතින අභ්‍යන්තර පාලන පද්ධතියේ අඩුපාඩු මේ සඳහා හේතු වී තිබුණි.

යොමුව - සිපිසිජි/කේඩී/එෆ්/ඩීඒපීඑච්/ඒ/2024/35

5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු 216 ක් පැවතුණු අතර තනතුරු 02 ක අතිරික්ත සේවක ප්‍රමාණය 23 ක් වේ.<br><br>යොමුව - සිපිසිජි/කේඩී/එෆ්/ඩීඒපීඑච්/එම්/2024/59 | මානව සම්පත් කළමනාකරණය මැනවින් පවත්වාගත යුතුය. | පිළිතුර පසුව ලබා දීමට කටයුතු කරන බව |

එම්.කේ.ඩී.එන්.මායාකඩුව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

19

## 4. කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 01 | දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන/ වසරකට) | ✓ | | |
| 02 | වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර ගණන/ වසරකට) | ✓ | | |
| 03 | වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය (කි.ග්‍රෑම් වසරකට) | ✓ | | |

**පශු වෛද්‍ය කාර්යාල මාසික වාර්තා, කුකුළු අභිජනන මාසික වාර්තා මත පදනම් වූ ඇස්තමේන්තුකළ නිෂ්පාදන දත්ත සහ මහ බැංකු වාර්ෂික වාර්තා මගින් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත.*

## 5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49 | 50%-74% | 75%-100% |
| (i) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම | වසර 2024 වන විට දේශීය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 392.50 වෙත ළඟා වීම | දේශීය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන/ වසරකට) | | | ✓ |
| (ii) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | වාර්ෂික බිත්තර නිෂ්පාදනය මිලියන 2960.59 වෙත ළඟා වීම | වාර්ෂික බිත්තර නිෂ්පාදනය (බිත්තර ගණන/ වසරකට) | | | ✓ |
| | වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය 254.66 (000' මෙ.ටො. /වසරකට) වෙත ළඟා වීම | වාර්ෂික කුකුළු මස් (000' මෙ.ටො. /වසරකට) | | | ✓ |
| (iii) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම | කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1% - 1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය | | ✓ | |

## 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

පසුගිය වසර කිහිපය තුළ සිදු වූ ආර්ථික අවස්ථාවරත්වය සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රය කෙරෙහි දැඩිව බලපෑ අතර එම හේතුවෙන් නිෂ්පාදනයෙහි පසු බෑමක්ද, වෙළඳපල මිලෙහි ඉහල යාමක්ද නිරීක්ෂණය විය.

2023 වසරේ දේශීය බිත්තර නිෂ්පාදනය වෙළඳපල අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් නොවුන හෙයින් පාරිභෝජනය සඳහා බිත්තර ආනයනය කිරිමට සිදුවිය. එබැවින් දේශීය බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෙටි කාලීන පියවරක් ලෙස 2023 වර්ෂයේ මව් සතුන් ට අමතරව, සංසේචිත බිත්තර ද ආනයනය කිරීමට අවසර දෙන ලදී. 2024 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය මිලියන 2953 දක්වා ඉහළ යාමට එය සෘජුවම බලපාන ලදී. එය 2023 වර්ෂයට සාපේක්ෂව 44% ක ඉහළ යාමකි. 2023 වර්ෂයේ ගෘහස්ථ මට්ටමින් ලබාගත හැකි බිත්තර ප්‍රමාණයෙන් (Availability) 8% ක් ආනයනික බිත්තර වන අතර එම අගය 2024 වර්ෂයේ 2% දක්වා පහත වැටිණි. නිෂ්පාදනය ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේ අවසානය වන විට දේශීය බිත්තරයක වෙළඳපොල සාමාන්‍ය මිළ රු. 38.31 ක් විය.

කුකුළු මස් නිෂ්පාදනය 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී 9.5% ක ඉහළ යාමක් දක්නට ලැබුණි. බ්‍රොයිලර් මව් සතුන් ගේ දේශීය නිෂ්පාදනය ද 2023 වර්ෂයට සාපේක්ෂව 400,000 ක ඉහළ යාමක් වාර්තා විය. එම නිසා බ්‍රොයිලර් සතුන් ගේ දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනය මිලියන 185 දක්වා ඉහළ යාමක් නිරීක්ෂණය විය.

බිත්තර සහ කුකුළු මස් කර්මාන්තය සඳහා සත්ත්ව ආහාර වල මිළ ද සෘජුවම බලපායි. බඩඉරිගු සහ සෝයා බෝංචි ආහාරය ආනයනය 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී 16.2% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර 2023 ට සාපේක්ෂව සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය වල මිළ ද 2024 වර්ෂයේ යම් අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය පිළිබඳ සැලකීමේදී සමස්ත නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට නොහැකි වුවද, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයෙහි කිරි නිෂ්පාදනයේ යම් වැඩිවීමක් දක්නට ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් 5.59% කි. ආර්ථික අර්බුදය නිසා කර්මාන්තයෙන් ඇත්වූ ගොවීන් නැවත ක්‍රමයෙන් කර්මාන්තය වෙත ළඟාවීමත්, කිරි කර්මාන්තය නඟා සිටුවීමට රජය විසින් ගෙන ඇති යම් යම් ක්‍රියාමාර්ගත් මෙම ක්ෂේත්‍රයේ වර්ධනයට හේතු වී ඇත.

තවද 2024 වර්ෂයේ ආනයනය කරන ලද කිරි හා කිරි නිෂ්පාදනවල ප්‍රමාණය කි.ග්‍රෑ.67,147,143 ක් වන අතර, 2023 ආනයනය කරන ලද ප්‍රමාණය කි.ග්‍රෑ. 71,180,195 කි. ඒ අනුව 2023 වසරට සාපේක්ෂව 2024 වර්ෂයේ ආනයනය කරන ලද කිරි හා කිරි නිෂ්පාදන වල අඩුවීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය විය. සමස්තයක් ලෙස 2024 වර්ෂයේ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනවල සුලභතාවය (Availability) 2023 වසරට සාපේක්ෂව 0.8% ක අගයකින් ඉහළ ගොස් ඇත.

2024 වර්ෂයේ අගභාගය වන විට රටපුරා පැතිරගිය අප්‍රිකානු සූකර උණ වසංගතය හේතුවෙන් සූකර කර්මාන්තයේ සැළකිය යුතු කඩාවැටීමක් සිදුවූ අතර සතුන් 70,000 ක පමණ ප්‍රමාණයක් මියයන ලදී. ඒ හේතුවෙන් 2024 වර්ෂයේ ඌරු මස් නිෂ්පාදනය, 2023 වර්ෂයට සාපේක්ෂව 5.44% ක අඩුවීමක් දක්නට ලැබිණි. එමෙන්ම 2023 වසරට සාපේක්ෂව එළුමස් නිෂ්පාදනයේ ද 2.55% ක අඩුවීමක් දක්නට ලැබේ.

# 6. මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 195 | 117 | 78 |
| තෘතීයික | 21 | 12 | 09 |
| ද්විතීක | 352 | 295 | 57 |
| ප්‍රාථමික | 395 | 324 | 72 |

## 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහායක සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ.

පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ප්‍රධානතම තාක්ෂණික නිලධාරී කණ්ඩායම පශු වෛද්‍ය නිලධාරීන් වන අතර ප්‍රධාන කාර්යාලයට හා පළාත් සභාවන්ට අනුයුක්ත පශු වෛද්‍ය නිලධාරීන් අනුමත ප්‍රමාණයට වඩා පුරප්පාඩු පවතින හෙයින් දීප ව්‍යාප්තව මෙන්ම අන්තර් ජාතික වශයෙන්ද පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල සේවාවන් සැපයීමේදී විශාල වශයෙන් ගැටළුකාරී තත්ත්වයන් සඳහා මුහුණපෑමට සිදු වේ. තවද විශ්ව විද්‍යාල මගින් පශු වෛද්‍ය උපාධිය සම්පූර්ණ කර පිටතට පැමිණෙන පශු වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට උත්සාහ කළද ලැබෙන වැටුප, දුෂ්කර රාජකාරීන් සිදු කිරීමට ඇති අකමැත්ත/ආකර්ශනයේ අඩුකම සහ අනෙකුත් පර්යේෂණාගාර හා රසායනාගාරවල හිඟකම වැනි පහසුකම් වල ගැටළුද හේතුවෙන් මේ සඳහා ඇතුලත් වීමට නවක නිලධාරීන් මැලිකමක් දැක්වීම මෙම නිලධාරී හිඟයට ප්‍රධාන හේතුවක් වී ඇත.

තවද මෙම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සත්ත්ව පාලන විද්‍යාල මගින් සත්ත්ව පාලන ඩිප්ලෝමාව හදාරා අවසන් වන සිසුන් මෙම දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන නිලධාරී සහ පළාත් සභා වල සත්ත්ව සංවර්ධන උපදේශක යන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කල හැකි නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත මේ වන විට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමාකර ඇති හෙයින් එම තාක්ෂණික තනතුරු වලද පුරප්පාඩු බහුලව පවතී. එමෙන්ම දුෂ්කර සේවයේ රාජකාරී ඉටුකිරීමේදී සහාය කටයුතු සඳහා අවශ්‍ය රියදුරන් මෙන්ම ලිපිලේඛන රාජකාරී කටයුතු සඳහා කාර්යාලගතව රාජකාරී ඉටුකරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන්ද පුරප්පාඩු පවතී.

ඒ අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අරමුණු හා වාර්ෂික ඉලක්ක කරා ලගාවීමේදී උක්ත නිලධාරී හිඟය බොහෝ අවස්ථාවලදී සීමාකාරී සාධකයක් බවට පත්විය.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම්/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|
| කිරිගව පාලනය | 54 | දින 02 | දේශීය | කිරිගව පාලන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය |
| ව්‍යාප්ති සේවනය හා සන්නිවේදනය | 18 | දින 03 | දේශීය | ව්‍යාප්ති සේවනය හා සන්නිවේදනය පිළිබඳ අවබෝධය |
| නවීන කුකුළු පාලනය | 35 | දින 03 | දේශීය | නවීන කුකුළු පාලන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය |
| ප්‍රතිඵල පාදක කරගත් සැලසුම්කරණය | 55 | දින 01 | දේශීය | ප්‍රතිඵල පාදක කරගත් සැලසුම්කරණය පිළිබඳ අවබෝධය |
| සාමාන්‍ය හැසිරීම සහ විනය | 23 | දින 02 | දේශීය | විනය පාලනයේ වැදගත්බව පිළිබඳ අවබෝධය |
| නායකත්ව පුහුණුව | 38 | දින 02 | දේශීය | රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය නායකත්වය පිළිබඳ අවබෝධය |
| කළමණාකරණ පුහුණුව | 18 | දින 02 | දේශීය | රාජ්‍ය සේවය සඳහා කළමණාකරණය පිළිබඳ අවබෝධය |
| මත්ස්‍ය පරපෝෂිත විද්‍යාව සහ පී.සී.ආර්. පුහුණුව | 17 | දින 01 | දේශීය | මත්ස්‍ය පරපෝෂිත විද්‍යාව හා එම ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය |
| පරිගණක පුහුණුව | 08 | දින 01 | දේශීය | පරිගණක තාක්ෂණය පිළිබඳ අවබෝධය |
| සිමාවාසික පුහුණුව | 28 | මාස 01 | දේශීය | පශු වෛද්‍යවරුන් සඳහා සිමාවාසික පුහුණුව |
| නිරෝගී දිවි පෙවෙතක් සඳහා නිසි පෝෂණය හා ව්‍යායාම අවශ්‍යතාවය | 10 | දින 01 | දේශීය | නිරෝගී දිවියක් සඳහා පෝෂණය හා ව්‍යායාම අවශ්‍යතාවය |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 45 | දින 01 | දේශීය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය |
| පාඩු,අලාභ හානි හා අත්හැර දැමීම | 102 | දින 02 | දේශීය | පාඩු,අලාභ හානි හා අත්හැර දැමීම පිළිබඳ අවබෝධය |
| පාඩු,අලාභ හානි හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 76 | දින 01 | දේශීය | පාඩු,අලාභ හානි හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුම |
| කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණය | 50 | දින 01 | දේශීය | කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණය පිළිබඳ අවබෝධය |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 38 | දින 01 | දේශීය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ අවබෝධය |
| ආරක්ෂාකාරි මාර්ග භාවිතය,ආකල්ප සංවර්ධනය හා මාර්ග නීති | 31 | දින 01 | දේශීය | ආරක්ෂාකාරී මාර්ග භාවිතය හා නීති පිළිබඳ අවබෝධය |
| වාහන නඩත්තුව | 21 | දින 01 | දේශීය | රාජ්‍ය සේවයේ වාහන නඩත්තුව පිළිබඳ අවබෝධය |
| මානසික සුවය සඳහා උපදේශන හා ව්‍යායාම අවශ්‍යතාවය | 51 | දින 01 | දේශීය | මානසික සුවය සඳහා අවශ්‍ය උපදේශන පිළිබඳ අවබෝධය |
| කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණය | 75 | දින 01 | දේශීය | කණ්ඩායම් ගොඩනැගීම සහ අභිප්‍රේරණය පිළිබඳ අවබෝධය |
| උද්‍යාන අලංකරණය | 52 | දින 01 | දේශීය | උද්‍යාන අලංකරණය පිළිබඳ අවබෝධය |
| අන්තර්ජාල සහ ඊමේල් - පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා | 13 | දින 01 | දේශීය | අන්තර්ජාල සහ ඊමේල් භාවිතය පිළිබඳ අවබෝධය |
| ඊමේල් සහ Google Drive | 14 | දින 01 | දේශීය | ඊමේල් සහ Google Drive භාවිතය පිළිබඳ අවබෝධය |
| අන්තර්ජාල සහ ඊමේල් –– සංවර්ධන නිලධාරීන්/ක.සේ.නිලධාරීන් | 14 | දින 01 | දේශීය | අන්තර්ජාල සහ ඊමේල් භාවිතය පිළිබඳ අවබෝධය |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|
| කිරිවල ගුණාත්මකභාවය පරීක්ෂාව | 09 | දින 01 | දේශීය | කිරිවල ගුණාත්මකභාවය පරීක්ෂාව පිළිබඳ අවබෝධය |
| ඊමේල්, Google Drive සහ අනෙකුත් ගුගල් පහසුකම් | 12 | දින 01 | දේශීය | ඊමේල්, Google Drive සහ අනෙකුත් ගුගල් පහසුකම් පිළිබඳ අවබෝධය |
| පරිපාලන රෙගුලාසි | 42 | දින 01 | දේශීය | පරිපාලන රෙගුලාසි පිළිබඳ අවබෝධය |
| පරිසර හිතකාමී පශුසම්පත් ගොවිපළකරණය | 35 | දින 02 | දේශීය | පරිසර හිතකාමී පශුසම්පත් ගොවිපළකරණය පිළිබඳ අවබෝධය |
| අන්තර්ජාල සහ ඊමේල් | 14 | දින 01 | දේශීය | අන්තර්ජාල සහ ඊමේල් භාවිතය පිළිබඳ අවබෝධය |
| MS Office | 12 | දින 01 | දේශීය | Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය |
| MS Office | 20 | දින 30 | දේශීය | Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය |
| MS Office | 16 | දින 01 | දේශීය | Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය |
| MS Office | 17 | දින 01 | දේශීය | Microsoft Office භාවිතය පිළිබඳ අවබෝධය |
| ලිංගභේදය නිර්ණය කිරීම සඳහා සකස්කළ ශුක්‍රාණු ඵලදායී ලෙස භාවිතා කිරීම | මාර්ගගත ක්‍රමය | | දේශීය | ලිංගභේදය නිර්ණය කිරීම සඳහා සකස්කළ ශුක්‍රාණු ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳ අවබෝධය |
| ව්‍යවසායකත්වකරණය | | | දේශීය | වසායකත්වය පිළිබඳ අවබෝධය |
| නවසීලන්ත කිරි ගොවිපලවල් හි පොහොසත්කම/දියුණුබව සම්බන්ධයෙන් ගවේෂණාත්මක පුහුණුව | | | දේශීය | නවසීලන්ත කිරි ගොවිපලවල් හි සංවර්ධනය පිළිබඳ අවබෝධය |
| කුකුළු ගොවිපළ සැලසුම්කරණය හා අයවැය නිර්ණය කිරීම | | | දේශීය | කුකුළු ගොවිපළ සැලසුම්කරණය හා අයවැය නිර්ණය කිරීම පිළිබඳ අවබෝධය |
| කුකුළු කර්මාන්තයේ ජෛව ආරක්ෂණය | | | දේශීය | කුකුළු කර්මාන්තයේ ජෛව ආරක්ෂණය පිළිබඳ අවබෝධය |
| ආර්ථික විද්‍යාත්මක වශයෙන් වැදගත් කිරිගව ගොවිපළ | | | දේශීය | ආර්ථික විද්‍යාමය වශයෙන් වැදගත් කිරිගව ගොවිපළ පිළිබඳ අවබෝධය |
| සූකර උණ- දෙමළ මාධ්‍ය | | | දේශීය | සූකර උණ පිළිබඳ අවබෝධය |
| සූකර උණ- සිංහල මාධ්‍ය | | | දේශීය | සූකර උණ පිළිබඳ අවබෝධය |

## 7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)** | අනුකූල වේ | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අංශවලින් පිළිතුරු ලබාදීමට කාලයක් ගැනීම | සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | තාවකාලිකව අත්හිටුවා ඇත. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම්** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 963කින් තනතුරු 216 පුරප්පාඩුව පවතී. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදුකර, සිටින කාර්ය මණ්ඩලය ඵලදායි ලෙස ගලපා ගැනීමෙන් අත්‍යාවශ්‍ය ලෙස හඳුනාගනු ලැබූ තාක්ෂණික තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ අග්‍රාමාත්‍ය අනුකමිටුව වෙත ඉල්ලීම් සිදු කරනු ලැබේ. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |